## දෙවැනි කොටස

## මහ බැංකුවේ ගිණුම් සහ කටයුතු

පිටුව


1. ගිණුම් .. .. 109
2. විදේශ විනිමය .. .. 109
3. දේශීය බැංකු කටයුතු .. .. 112
4. විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය .. 113
5. බැංකු කටයුතු සංවර්ධනය .. .. 113
6. විදේශ ව්‍යවහාර මුදල් නිකුතුව .. 114
7. බැංකු පරිපාලන .. .. 114
8. සංවර්ධන මුදල් .. .. 114
9. රාජ්‍ය ණය .. .. 121
10. විනිමය පාලනය .. .. 126
11. සේවක අර්ථ සාධක අරමුදල .. 127
12. සංඛ්‍යාන .. .. 129
13. ආයතන කටයුතු .. .. 131
14. පුහුණු කිරීම් .. .. 132
15. කාර්ය මණ්ඩල පුවත් .. .. 132

# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

## ගිණුම්

1980 දෙසැම්බර් 31 වන දින වන විට මහ බැංකුවේ ශේෂ පත්‍රය හා 1980 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභ අලාභ ගිණුම 2·1 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

1979 දෙසැම්බර් 31 වන දින වන විට පැවති රු. 16,835,932,601 සමඟ සසඳන විට 1980 දෙසැම්බර් 31 දින වන විට මහ බැංකුවේ මුළු වත්කම් ප්‍රමාණය රු. 22,831,653,904 ක්ව පැවතියේය. වත්කම්වල වැඩිවීම් වලට ප්‍රධාන හේතුව වූයේ 1979 දෙසැම්බර් 31 වන විට පැවති රු. 4,517,107,299 සිට 1980 දෙසැම්බර් 31 දින වන විට රු. 12,199,446,333 දක්වා දේශීය වත්කම්වල වැඩිවීමක් සිදු වීමය; 'වෙනත් වත්කම් හා ගිණුම්' වල ශේෂයන්ද රු. 4,358,595,506 සිට රු. 6,227,920,667 දක්වා වැඩි විය. එසේ වුවද, බැංකුවේ මුදල් ශේෂයන්ගේ අඩු වීම් වලින් ප්‍රත්‍යක්ෂ වන, බැංකුවේ ජාත්‍යන්තර සංචිතය රු. 7,960,229,796 සිට රු. 4,404,286,904 දක්වා අඩු වීමෙන් මෙම වැඩි වීම අර්ධ වශයෙන් අඩු වී ගියේය.

සමාලෝචිත කාලසීමාව තුළදී බැංකුවේ වගකීම්වල ඇති වූ වැඩිවීමට බොහෝ සෙයින් හේතුවූයේ ව්‍යවහාර මුදල් සංසරණය රු. 4,321,140,913 සිට රු. 5,009,516,039 දක්වා ද, තැන්පතු වගකීම් රු. 4,474,739,731 සිට රු. 5,342,535,514 දක්වා ද, 'වෙනත් වගකීම් හා ගිණුම්' පිළිබඳ ශේෂයන් රු. 7,590,680,268 සිට රු. 11,336,040,572 දක්වාද වැඩි වීමය.

1980 වර්ෂය තුළ රු. 2,602,098,160·05 ක් වූ බැංකුවේ ආදායම කලින් වර්ෂයේ ආදායමට වඩා රු. 1,633,708,158 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. වියදම, සංචිත සඳහා වෙන් කැරුම් හා අගයක්ෂය සඳහා ප්‍රතිපාදන රු. 2,601,098,160·05 ක් විය. ශුද්ධ ලාභය වූ රුපියල් දශ ලක්ෂයක් අතිරික්තයට එක් කරන ලදී. 1980 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 250 ක මුදලක් බැංකුවේ පොදු සංචිතයෙන් මධ්‍යම හා දීර්ඝ කාලීන ණය අරමුදලට පවරන ලද අතර, ණය ආයතනයනට මධ්‍යම හා දීර්ඝ කාලීන ණය දීම සඳහා ඇති සම්පත් සැහෙන පමණින් වැඩි විය. රු. 83,750,000 ක වැඩිපුර මුදලක්ද ප්‍රාග්ධන දායක ගිණුමට පවරන ලදී. මෙම දායකත්වය දෙන ලද්දේ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ හා ජාතික සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධන වැඩි කිරීමේ කාර්යය සඳහාය.

## විදේශ විනිමය

බැංකුව, සෑම වැඩ කරන දිනයකම, විදුලි සංදේශ පැවරුම් සඳහා ව්‍යවහාර මුදල් වර්ග සයක්, එනම්, එ. ජ. ඩොලර්, රන්පවුම්, ඩොයිෂ් මාක්, ප්‍රංශ ප්‍රෑන්ක්, ජපන් යෙන් හා ඉන්දියානු රුපියල් වෙනුවෙන් නිළ විනිමය අනුපාත නියම කිරීම තවදුරටත් කරගෙන ගියේය. 1980 අවසන් වන විට පැවති, මෙම ව්‍යවහාර මුදල් සඳහා වූ විනිමය අනුපාතයන් 2·2 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. බැංකුව, විදේශ ව්‍යවහාර මුදල් පිළිබඳ කටයුතු තවදුරටත් වෙළෙඳ බැංකු සමඟ පවත්වාගෙන ගියේය.

**2·2 සංඛ්‍යා සටහන**

**විනිමය අනුපාත**

ශ්‍රී ලංකා රුපියල්

| ව්‍යවහාර මුදල් ඒකක 100 කට | 1980 වර්ෂය අවසානයේ මැදි අනුපාතය |
|---|---|
| එ. ජ. ඩොලර් .. .. | 1800·00 |
| රන් පවුම් .. .. | 4269·55 |
| ඩොයිෂ්මාර්ක් .. .. | 921·25 |
| ප්‍රංශ ෆ්‍රෑන්ක් .. .. | 397·50 |
| ජපන් යෙන් .. .. | 8·7550 |
| ඉන්දියානු රුපියල් .. .. | 228·75 |

## 1980 දෙසැම්බර් මස 31 දිනට

### 1980 දෙසැම්බර් මස 31

### ව ග කී ම්

| 1979 දෙසැම්බර් මස 31 දින රුපියල් | | | 1980 දෙසැම්බර් මස 31 දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ප්‍රාග්ධන ගිණුම්** | | |
| 1,50,00,000 | | ප්‍රාග්ධනය .. | 1,50,00,000 | |
| 6,40.00,000 | 7,90,00,000 | අතිරික්තය .. | 6,50,00,000 | 8,00,00,000 |
| | | **වගකීම්** | | |
| 413,99,47,484 | 432,11,40,913 | සංසරණයෙහි පවත්නා නෝට්ටු .. | 480,76,02,981 | |
| 18,11,93,429 | | සංසරණයෙහි පවත්නා කාසි .. | 20,19,13,058 | 500,95,16,039 |
| | | **තැන්පතු** | | |
| 72,83,69,702 | | රජය .. | 134,58,00,620 | |
| 1,20,12,495 | | රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතන .. | 1,32,11,080 | |
| 96,60,34,215 | | වෙළෙඳ බැංකු .. | 126,36,74,391 | |
| 252,89,19,886 | | ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන .. | 237,39,49,480 | |
| 3,12,753 | | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු.11,17, 36,575/- හැර අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල .. | 85,458 | |
| 23,90,90,680 | 447,47,39,731 | අනෙකුත් .. | 34,58,14,485 | 534,25,35,514 |
| | 6,91,21,689 | විදේශීය ණය ගැනීම් .. | | 42,85,61,779 |
| | 27,50,00,00 | මධ්‍යම හා දිගුකාලීන ණය අරමුදල .. | | 52,50,00,000 |
| | 2,62,50,00 | ප්‍රාග්ධන දයක දීමනා ගිණුම .. | | 11,00,00,000 |
| | 759,06,80,268 | අනෙකුත් වගකීම් හා ගිණුම් .. | | 1,133,60,40,572 |
| | 1,683,59,32,601 | | | 2,283,16,53,904 |

### 1980 දෙසැම්බර් මස 31 වැනිදයින්

| 1979 දෙසැම්බර් මස 31 දින රුපියල් | | 1980 දෙසැම්බර් මස 31 දින රුපියල් |
|---|---|---|
| 96,73,90,002 | සාමාන්‍ය වියදම් (වැටුප්, මුදල් නෝට්ටු හා කාසි සඳහා වියදම් හා බැංකු ගොඩනැගිලි හා කාර්යාල උපකරණ සඳහා ක්ෂයවීම් ඇතුළුව) සහ මුදල් නීති පණතේ 38 වැනි වගන්තිය ප්‍රකාර ඉන් පසුව කරන ලද වෙන් කිරීම් .. | 260,10,98,160 |
| 10,00,000 | ශේෂය 1980 දෙසැම්බර් මස 31 වැනිදයින් අවසන් වූ වර්ෂයේ ශුද්ධ ලාභයයි. මෙම ලාභය මුදල් නීති පණතේ 39 (ආ) වගන්තිය ප්‍රකාර අතිරික්තයන් වශයෙන් එතැන් සිට යොද ගන්නා ලදී. | 10,00,000 |
| 96,83,90,002 | | 260,20,98,160 |

**ඩබ්ලිව්. රාසපුත්‍රම්**
අධිපති.

**යූ. ඒ. ද සිල්වා**
ප්‍රධාන ගණකාධිකාරී.

# ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්

## දිනට ශේෂ පත්‍රය

### වත්කම්

| 1979 දෙසැම්බර් මස 31 දින රුපියල් | | | 1980 දෙසැම්බර් මස 31 දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ජාත්‍යන්තර සංචිතය** | | |
| | | පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් .. | 393,74,19,823 | |
| 723,80,23,657 | | *විදේශීය රාජ්‍ය හා රාජ්‍ය නොවන සුරැකුම්පත් .. | 46,68,67,081 | |
| | | විශේෂ ආපසු ගැනීම් හිමිකම් පත් .. | — | 440,42,86,904 |
| 28,15,23,784 | | | | |
| | | **දේශීය වත්කම්** | | |
| 44,06,82,355 | 796,02,29,796 | ණය සහ අත්තිකාරම් .. | | |
| | | රජයට .. | 162,76,37,810 | |
| | | අනෙකුත් අයට- මධ්‍යම හා දිගුකාලීන .. | 21·01,31,641 | |
| 113,65,00,000 | | කෙටිකාලීන .. | 91,37,69,800 | |
| 9,12,44,688 | | රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් .. | 933,79,07,082 | |
| 55,69,08,000 | | මූල්‍ය හා අනෙකුත් ආයතනවලට දයක දීමනා .. | 11,00,00,000 | 1,219,94,46,333 |
| | | අනෙකුත් වත්කම් හා ගිණුම් .. | | 622,79,20,667 |
| 270,62,04,611 | | | | |
| 2,62,50,000 | 451,71,07,299 | | | |
| | 435,85,95,506 | | | |
| | 1,683,59,32,601 | | | 2,283,16,53,904 |

*1964 පෙබරවාරි මස 1 වැනි දින රු. 54,41,169/- ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 වැනි දින රු. 57,450/- ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතන වලින් ලබාගත් සුරැකුම්පත් ඇතුළත් වෙයි. (ඒ දිනවල මෙකී සුරැකුම්පත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙලින් රු. 28,67,960/- ක් සහ රු. 34,340/- ක් විය.)

## අවසන් වූ වර්ෂයේ ලාභාලාභ ගිණුම

| 1979 දෙසැම්බර් මස 31 දින රුපියල් | | | 1980 දෙසැම්බර් මස 31 දින රුපියල් | |
|---|---|---|---|---|
| | | පොලී ආදිය .. | | 260,20,98,160 |
| | 96,83,90,002 | | | |
| | 96,83,90,002 | | | 260,20,98,160 |

1980 දෙසැම්බර් මස 31 වැනි දිනට අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය සමග කියවන ලද 1971 අංක 38 දරණ මුදල් නීති පණතේ 13(1) වගන්තිය සහ මුදල් නීති පණතේ (පරි. 422) 42 (1) වගන්තිය අනුව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මුදල් නීති පණතේ (පරි. 422) 42 (2) වගන්ති ප්‍රකාර මුදල් ඇමතිතුමා වෙත ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව යථාකාලයේදී ඉදිරිපත් කෙරේ.

ජී. එම්. ඩබ්ලිව්. විජයසූරිය
විගණකාධිපති.

1981 මාර්තු මස 31 වැනි දින,
කොළඹ 7.
විගණක කාර්යාලයේදීය.

**ආසියානු නිශ්කාෂණ සංගමය**

ආසියානු නිශ්කාෂණ සංගමය (ආ.නි.ස.) මාර්ගයෙන් කැරෙන මහ බැංකු ගණුදෙනු පිළිබඳව පැහැදිලි වැඩි වීමක් තවදුරටත් සමාලෝචිත වර්ෂය තුළදී පෙනී ගියේය. කෙසේ වුවද, කලින් වර්ෂයේ පැවති රුපියල් දශ ලක්ෂ 754·2 හා සසඳන විට බේරුම් කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව විසින් ආ. නි. සංගමයට ගෙවන ලද ශුද්ධ මුදල රුපියල් දශ ලක්ෂ 675·1 ක් විය,

නිශ්කාෂණය සඳහා නව ක්‍රියා පිළිවෙතක් 1980 ඔක්තෝබර් 1 වැනි දින හඳුන්වා දෙන ලද අතර, එම ක්‍රියා පිළිවෙත ප්‍රකාර එක් එක් කේවල ගණු දෙනු, මහ බැංකු මාර්ගයෙන් බේරුම් කිරීම වෙනුවට හවුල්කාර රටවල ස්වකීය ගණු දෙනු කරුවන් සමගම කේවල ගණු දෙනු බේරුම් කර ගැනීමටද, අතිරික්ත ශේෂයන් පිළිබඳ කටයුතු නිම කර ගැනීම සඳහා ඔවුන්ගේ අනුරූප ගිණුම්වලට මුදල් ලබා ගැනීමේ කාර්යය සඳහා පමණක් මහ බැංකුවලට පැමිණීමටත් වෙළෙඳ බැංකුවලට අවසර දෙනු ලැබේ.

**පෙරළා සිය රට යන ඉන්දියානුවන් වෙත ආධාරක හා කරුණා සහගත ගෙවීම්**

1964 ඉන්දු-ලංකා ගිවිසුම මගින් ආවරණය කැරුණු ඉන්දියානු සම්භවය ඇති වතු කම්කරුවන් පෙරළා සිය රට යෑම ඉක්මන් කරවනු පිණිස, රජය වෙනුවෙන් සැලසුම් දෙකක් ක්‍රියාත්මක කරවීම බැංකු විසින් නොකඩවා කරගෙන යන ලදී. මේවා නම් — (1) ආධාර ක්‍රමයක්, මේ ක්‍රමය අනුව එකී පෙරළා සිය රට යන්නන් හට, ප්‍රේෂණය කිරීමට බලය දෙන ලද ප්‍රමාණය හෝ ඉන් කොටසක් වෙනුවෙන් සියයට 65 ට සමාන මුදලක් ගෙවන ලද අතර (2) මෙම කම්කරුවන්ට දිවයින හැර යාම සඳහා දිරි ගැන්වීමක් වශයෙන් කරුණා සහගත ගෙවීමක් ලෙස රු. 500 ක් හා එම මුදලින් සියයට 65 ක්ද ගෙවන ලදී. බැංකුව මෙම සැලසුම් දෙක වෙළෙඳ බැංකු මගින් ක්‍රියාත්මක කළේය.

## දේශීය බැංකු කටයුතු

රජයේ සුරැකුම්පත් හා වාණිජ හා නිෂ්පාදන ණයට අදාළ භාවිතීය පොරොන්දු නෝට්ටු මත වෙළෙඳ බැංකුවලට දෙනු ලබන කෙටිකාලීන ප්‍රතියෝජන සඳහා වන මහ බැංකු පොළී අනුපාතය 1980 අප්‍රියෙල් 21 දින පටන් සියයට 10 සිට සියයට 12 දක්වා වැඩි කරන ලදී.

කෙසේ වුවද, බැංකු අනුපාතයට අනුව මහ බැංකුවෙන් ලබා ගන්නා වෙළෙඳ බැංකු ණය මත සීමාවන් පනවන ලදී. රජයේ කෘෂිකාර්මික ණය ක්‍රමය හැර එක් එක් බැංකුව 1979 දෙසැම්බර් 31 වන විට ලබාගෙන තිබූ ණය, වට්ටම් කළ හා මුදල් යෙදවූ අයිරා හා බිල්පත්වල සමස්තයෙන් සියයට 4 ක උපරිමයක් දක්වා එම බැංකුවලට ණය ලබා දෙන ලද අතර, එසේ කරන ලද්දේ අත්‍යවශ්‍ය නොවන කාර්යයන් සඳහා වන බැංකු අත්තිකාරම්, 1976 ජූනි 30 දින වන විට පැවති එකී අත්තිකාරම්වල මට්ටම නොඉක්මවන්නේ නම් පමණකි. එබඳු ඉක්මවීම් ප්‍රමාණය සියයට 4 ක උපරිමයෙන් අඩු කළ යුතු විය.

තවද බැංකුව, දණ්ඩන අනුපාත පිළිබඳ ක්‍රමණගත පරිමාණය පදනම් කරගෙන ඉහත සඳහන් සීමාවන් ඉක්මවා ද වෙළෙඳ බැංකුවලට අත්තිකාරම් ලබා දුන්නේය. නිර්ණිත සීමාවන්ට වඩා වැඩියෙන් එක් එක් බැංකුව විසින් ලබා ගැණුන ණය මට්ටම සැළකිල්ලට ගනිමින් 1980 අප්‍රියෙල් 21 දින සිට බලපැවැත්වූ දණ්ඩන අනුපාතයන් වර්ෂයකට සියයට 20 සිට වර්ෂයකට සියයට 30 අතර වෙනස් විය.

වෙළෙඳ බැංකු විසින්, සමුපකාර සමිති, කෘෂිකාර්මික සේවා මධ්‍යස්ථාන හා බලය ලත් පුද්ගලයනට සහතික කළ මිළ ක්‍රමය යටතේ වී මිළදී ගැනීම හා මෙරට වැවෙන වෙනත් සමහර නියමිත භෝග වර්ග මිළදී ගැනීම, ගබඩා කිරීම හෝ විකිණීම සඳහා මුදල් යෙදවීම පිණිස භාවිතීය නෝට්ටු මත මහ බැංකුව විසින් වෙළෙඳ බැංකුවලට දෙන අත්තිකාරම්වල පොළී අනුපාතය, වර්ෂයකට සියයට 3 ක මට්ටමෙහි නොවෙනස්ව පැවතියේය. වී, එළවළු හා වෙනත් නියමිත භෝග වර්ග නිෂ්පාදනයට සම්බන්ධ සමුපකාර සමිති හෝ ගොවීන්ගේ භාවිතීය පොරොන්දු නෝට්ටු මත වෙළෙඳ බැංකුවලට දෙන ලද බැංකුවේ අත්තිකාරම්වල පොළී අනුපාතය වර්ෂයකට සියයට 1·5 ක්ව තවදුරටත් පැවතියේය.

### රජයේ ගිණුම්

බැංකුව තවදුරටත්, රජයේ දෙපාර්තමේන්තු හා සමහර සංස්ථාපිත මණ්ඩලවල ගිණුම් පවත්වාගෙන ආයේය. 1980 වර්ෂය අවසානයේ පැවැති ප්‍රකාර රජයේ ගිණුම් ශාඛාවෙහි තිබූ ක්‍රියාත්මක ගිණුම් සංඛ්‍යාව ඉකුත් වර්ෂයේ තිබූ ගිණුම් සංඛ්‍යාවට වඩා ගිණුම් 11 ක වැඩි වීමක් පෙන්නුම් කළේය.

### භාණ්ඩාගාර බිල්පත්

භාණ්ඩාගාර බිල්පත් සඳහා වන මහ බැංකු වට්ටම් අනුපාතය, ටෙන්ඩර කැඳවීම මගින් හෝ මහා බැංකුවෙන් එකී භාණ්ඩාගාර බිල්පත් මිළදී ගත් අනුපාතයට වඩා තවදුරටත් සියයට 1/8 ක් වැඩියෙන් පැවතිණි.

### අනිවාර්ය ඉතිරි කිරීම

1971 අංක 6 දරන අනිවාර්ය ඉතිරි කිරීම් පනත හා 1972 අංක 15 දරන ආදායම් සීමා කිරීමේ සහ අනිවාර්ය ඉතිරි කිරීමේ නීතිය යටතේ එකතු කරන ලද මුදල්වල භාරකරු වශයෙන් තවදුරටත් ක්‍රියා කළ මහ බැංකුව, රජය වෙනුවෙන් අනිවාර්ය ඉතිරි කිරීමේ අරමුදල් පරිපාලනය කළේය. වර්ෂය තුළදී බැංකුව රුපියල් 18,996,503·78 ක මුදලක් (ලැබුණු ප්‍රතිලාභ අයදුම්පත් 4,900 මත වූ පොළියද ඇතුළුව) දයකයිනට ගෙවීය.

## විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය

1979 වර්ෂයේදී ආරම්භ කරන ලද විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය තවදුරටත් 1980 වර්ෂය තුළද ක්‍රියාත්මක විණි. මෙම ක්‍රමය යටතේ අනේවාසිකයන්, මහ කොළඹ ආර්ථික කොමිසමේ ව්‍යවසායයන් හා නිර්ණිත පුද්ගලයන් සමග ව්‍යාපාරික ගණු දෙනු කිරීමේ කාර්යය උදෙසා, වෙළෙඳ බැංකුවල දේශීය බැංකු කටයුතු ඒකක වලින් පරිබාහිර වූ විදේශ ව්‍යවහාර මුදල් බැංකු කටයුතු ඒකක ක්‍රියාත්මක කිරීමට ලංකාවේ මෙහෙයවුම් කටයුතුවල නියැලි වෙළෙඳ බැංකුවලට බලය දෙනු ලැබේ. ඕනෑම නිර්ණිත විදේශ ව්‍යවහාර මුදලකින් අරමුදල් ලබා ගැනීම, ණය හා අත්තිකාරම් දීම පිණිස කාලීන හා ඉල්ලුම් තැන්පතු (නමුත්, ඉතිරි කිරීමේ ගිණුම් හා චෙක්පත් මගින් මුදල් ආපසු ලබාගත හැකි ගිණුම් නොවේ) භාර ගැනීමට මෙම ඒකක වලට අවසර දෙනු ලැබේ. කෙසේ වුවද, අපනයන ඉපැයීම්වලින් ලැබෙන තැන්පතු භාර ගැනීමට ඔවුනට අවසර දෙනු නොලැබේ. මෙම ක්‍රමය යටතේ නිර්ණිත ව්‍යවහාර මුදල් නම්, එක්සත් ජනපද ඩොලර්, රන් පවුම්, ප්‍රංශ ප්‍රැන්ක්, ජපන් යෙන්, ඕලන්ද ගිල්ඩර්, ස්වීඩන් ක්‍රෝනර්, ස්විට්සර්ලන්ත ප්‍රැන්ක්, ඩොයිෂ් මාර්ක්, හොංකොං ඩොලර්, සිංගප්පූරු ඩොලර් ආදියය.

## බැංකු කටයුතු සංවර්ධනය

1980 වර්ෂය තුළදී, ශ්‍රී ලංකාවෙහි ශාඛා පිහිටුවීම සඳහා විදේශීය බැංකු වලින් අයදුම් පත් හතරක් මහ බැංකුව වෙත ලැබිණි. මේවා පිරික්සා බලා කටයුතු කිරීම බැංකුවේ බැංකු සංවර්ධන අංශයේදී සිදු වූ අතර මුදල් මණ්ඩල නිර්දේශයන් අනුමැතිය සඳහා ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරන ලදී. අයැදුම්පත් 11 න් 7 ක් 1979 සිට අනුමැතිය අපේක්ෂාවෙන් තිබූ ඒවාය. මෙම සංඛ්‍යාවෙන් බැංකු 8 ක් පිහිටුවීම 1980 දී ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් අනුමත කරන ලදී. මෙම විදේශීය බැංකු වලින් 7 ක් 1980 වර්ෂයේ දී ශ්‍රී ලංකාවෙහි ව්‍යාපාරික කටයුතු ඇරඹීය.

මෙම වර්ෂය තුළදී, රාජ්‍ය බැංකු දෙක වන ලංකා බැංකුව හා මහජන බැංකුව, පිළිවෙලින් ශාඛා 27 ක් හා 30 ක් විවෘත කළෝය. හැටන් නැෂනල් බැංකුව එක ශාඛාවක් විවෘත කළේය. 1980 වර්ෂය අවසානය වන විට දිවයිනෙහි ක්‍රියාත්මක වූ මුළු බැංකු ශාඛා සංඛ්‍යාව 630 ක් විය. දනුදු කෘෂිකාර්මික නිෂ්පාදන මධ්‍යස්ථානවල ක්‍රියාත්මකව පවත්නා, ලංකා බැංකුවේ කෘ. සේ. ම. ශාඛා 145 ද මෙම සංඛ්‍යාවට ඇතුළත් වේ.

## ව්‍යවහාර මුදල් නිකුතුව

1980 වර්ෂය අවසානයේදී සමස්ත ව්‍යවහාර මුදල් සංසරණය රුපියල් දශ ලක්ෂ 5009.5 ක්වූ අතර මෙය 1979 වර්ෂය සඳහා අනුරූප සංඛ්‍යාව වූ රුපියල් දශලක්ෂ 4,321.1 ට වඩා රුපියල් දශලක්ෂ 688.3 ක වැඩිවීමක් වූයේය. 1980 වර්ෂයේ නෝට්ටු සංසරණය රුපියල් දශලක්ෂ 667·6 කින් වැඩිවූ අතර කලින් වර්ෂයේ එය රුපියල් දශ ලක්ෂ 783.5 ක් විය. සමස්ත වැඩිවීමෙහි රු. 50 හා රු. 100 වටිනාකමෙන් යුතු නෝට්ටු වැඩිවීම රුපියල් දශලක්ෂ 264.7 ක් හා රුපියල් දශලක්ෂ 285.2 ක් විය. 1980 වර්ෂයේ කාසි සංසරණයෙහි සමස්ත වැඩිවීම රුපියල් දශලක්ෂ 20.7 ක් වූ අතර 1979 වර්ෂයේ එය දශලක්ෂ 29·1 ක් විය. මෙහි සමස්ත වැඩිවීමෙහි රු. 1 හා ශත 50 වටිනාකමින් යුතු කාසි සංසරණය රුපියල් දශලක්ෂ 12.5 ක් විණි.

රුපියල් 10 ව්‍යවහාර මුදල් නෝට්ටුව පිළිබඳව පැවති අධික භාවිතය ලිහිල් කරනු වස්, ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට රුපියල් 20 වටිනාකමින් යුතු ව්‍යවහාර මුදල් නෝට්ටුවක් හඳුන්වා දෙන ලදී.

## බැංකු පරිපාලන

මුදල් නීති පනතේ 29 වෙනි වගන්තිය යටතේ බැංකු පරිපාලන දෙපාර්තමේන්තුව විසින් 1980 වර්ෂයේදී බැංකු ආයතන නවයක පරීක්ෂණ කටයුතු ආරම්භ කළ අතර ඉන් හයක පරීක්ෂණ කටයුතු අවසන් කරනු ලැබීය.

තවද වර්ෂ 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලන පනතේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික වැඩ කටයුතුවලද දෙපාර්තමේන්තුව නිරත විය. මුදල් සමාගම් ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ රීති මුදල් මණ්ඩලය විසින් සම්පාදනය කරන ලදී. මුදල් සමාගම් වලින් ලැබුණු ඉල්ලුම්පත් අගැයීම් කරන ලද අතර පනත යටතේ මුදල් සමාගම් 56 ක් මුදල් මණ්ඩලය යටතේ මෙම වර්ෂය තුළදී ලියාපදිංචි කරන්ට යෙදුණි. මුදල් සමාගම් පරීක්ෂා කිරීමද 1980 වර්ෂය තුළදී ආරම්භ කරන ලදී.

මෙම දෙපාර්තමේන්තුව විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය යටතේ වාණිජ බැංකු විසින් ස්ථාපනය කරන ලද විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් කරනු ලබන ගනුදෙනු පිළිබඳව විමසිලිමත්ව සිටීමේ වැඩ පිළිවෙලෙහි දිගටම නියුතු විය.

## සංවර්ධන මුදල්

1980 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවෙහි කාර්යයන් තවදුරටත් වර්ධනය විය. මෙරටෙහි වාණිජ බැංකු සහ අනෙකුත් ණය දෙන ආයතන විසින් ඔවුන්ගේ මධ්‍ය හා දිගු කාලීන මූල්‍ය සැපයීම් කටයුතු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මධ්‍ය සහ දිගුකාලීන ණය අරමුදලෙහි සම්පත් කෙරෙහි වඩාත් නැඹුරුවීමක් පෙන්නුම් කරමින් එම අරමුදල යටතේවූ ණය දීමේ කටයුතු තවදුරටත් වර්ධනය වී යාම 1980 වර්ෂයෙහි සැලකිය යුතු කාර්යය ලෙස සඳහන් කළ හැක. ණය සහතික ක්‍රමයන් පිළිබඳව සලකා බලන විට සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සුමක) ණය සහතික ක්‍රමය විෂයෙහි ලා ඉතා විශාල අයදුම්පත් සංඛ්‍යාවක් ගලා ඒමක් 1980 වර්ෂය තුළදී දැකිය හැකි විය. සුළු පරිමාණ කර්මාන්ත ණය සහතික ක්‍රමය පිළිබඳව සලකා බලන විට අයදුම් පත් සංඛ්‍යාවෙහි පහත වැටීමක් දක්නා ලදී. රජයේ දෙපාර්තමේන්තු විසින් අනුග්‍රහ දක්වනු ලබන සංවර්ධන යෝජනා ක්‍රම සැකසීමෙහි හා ඒවා ක්‍රියාත්මක කිරීමෙහි ලා මෙම දෙපාර්තමේන්තුව ක්‍රියාශීලීව කටයුතු කළ බව කිව හැක. මාතර පිහිටවනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය ශාඛාව පිළිබඳ ආරම්භක කටයුතු සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් දෙනු ලබන ණය මුදල්වලින් සැදුම් ලත් අරමුදලක් මගින් මෙහෙය වනු ලබන ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය පිහිටවීමෙහි කටයුතු දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලදී.

**මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදල**

පසුගිය දශකයෙහිදී මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදල යටතේ වූ ප්‍රතිමූල්‍ය ක්‍රමයෙහි මූලික අරමුණ වූයේ ආර්ථිකයෙහි කෘෂිකාර්මික හා කර්මාන්ත අංශයන්හි මධ්‍ය හා දිගු කාලීන ණය අවශ්‍යතා වලට ණය පහසුකම් සැලසීම කෙරෙහි වාණිජ බැංකු සහ අනෙකුත් ණය දෙන ආයතනයන් උනන්දු කරවීමය. 1979 දෙවන භාගයෙහිදී ආර්ථිකයෙහි වඩාත් ප්‍රමුඛත්වය දියයුතු අංශයන් කෙරෙහි සම්පත් යෙදවීම සඳහා මෙම ප්‍රතිමූල්‍ය ක්‍රමයෙහි ප්‍රධාන වෙනස්කම් කීපයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලදී. මෙම සම්පත් යළි යෙදවීම ප්‍රතිමූල්‍ය ප්‍රමාණය විවිධ කිරීමෙන්, ප්‍රතිමූල්‍ය ප්‍රතිශතය සහ විවිධ අංශයන්ගේ අවශ්‍යතාවයන් හා ගැටළු ගැන සලකා බලා අනෙකුත් නීති සහ කොන්දේසි විවිධාංගී කරණය කිරීමෙන් සපුරා ගන්නා ලදී. 1980 වර්ෂය තුලදී වාණිජ බැංකු සහ අනෙකුත් ණය දෙන ආයතන අපනයන පිණිස වන කර්මාන්ත සංවර්ධනයෙහිලා වඩාත් පුළුල් ලෙස සහභාගි විය හැකිවනු පිණිස ප්‍රතිමූල්‍ය ක්‍රමයෙහි පරමාර්ථයන් තවදුරටත් විස්තීර්ණ කරණ ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි සහාය ද ඇතිව සකසන ලද ණය පහසුකම් ක්‍රමයක් මගින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපනයනය සඳහා පිහිටවන ලද කර්මාන්තයක් ලෙස සලකනු ලබන කර්මාන්තයකට මෙරටෙහි කවර වාණිජ බැංකුවකින් හෝ ණය දෙන ආයතනයකින් අනුග්‍රහ මූල්‍ය පහසුකම් ලැබීමට සුදුසුකම් දෙන ලදී. මෙම ක්‍රමය යටතේ ප්‍රදානය කරන ලද ණය මුදල් වලට මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදල යටතේ සියයට 10 ක ප්‍රතිමූල්‍ය පොළී ප්‍රමාණයකට යටත්ව එම ණය මුදලෙන් සියයට 80 ක ප්‍රමාණයකට ප්‍රතිමූල්‍ය පහසුකම් ලැබීමට හැකියාව ලබාදෙන ලදී. බැංකු වලින් මෙම ණය පාරිභෝගිකයාට දිය යුත්තේ සියයට 13 ක පොළී ප්‍රමාණයකට යනුවෙන් ද නියම කෙරිණ.

පහත දැක්වෙන අංශ 4 ට අයත් යෝජනා ක්‍රම/ණය මුදල් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රතිමූල්‍ය ක්‍රමය යටතේ ආධාර ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

1. පළමුවන කාණ්ඩය අමාත්‍යාංශ වල අනුමැතිය ලත් යෝජනා ක්‍රම යටතේ කෘෂිකර්ම හා ධීවර කටයුතු සඳහා දෙනු ලබන ණය මුදල් වලින් යුක්ත වේ.

2. දෙවන අංශය ශ්‍රී ලංකාවෙහි අපනයන සංවර්ධනය හෝ නඟා සිටුවීමට අදල වන භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය සහ එවැනි නිෂ්පාදනයන් හා සම්බන්ධිත කෘෂිකාර්මික නිපැයුම් වගා කිරීමත් කෘෂිකාර්මික සහ කාර්මික නිෂ්පාදනයන් අපනයන සඳහා සැකසීම හෝ පිළියෙල කිරීමට පහසුකම් සැලසීමත් සඳහා දෙනු ලබන ණය මුදල් වලින් යුක්ත වේ.

3. බදු සහන කාල සීමාවන් රැගත් (1979 අංක 28 දරන දේශීය ආදයම් බදු පනතෙහි 17 ඡේදය අනුව) අනුමත ආයෝජනයන් සඳහා දෙනු ලබන ණය මුදල් සහ රජයේ අමාත්‍යාංශවල අනුමතිය ලද යෝජනා ක්‍රම වලින් බැහැරවූ කෘෂිකාර්මික සහ ධීවර කටයුතු සඳහා ප්‍රදානය කරනු ලබන ණය මුදල් තෙවන ගණයට අයත් වේ.

4. 4 වන කාණ්ඩයට අයත් වනුයේ ඉහත සඳහන් 1, 2 සහ 3 වන කාණ්ඩ වලට අයත් අංශයන් හැර මුදල් නීති පනතේ 88 (අ) වගන්තියෙන් විස්තර කර ඇති පරිදි "ඵලදායි කාර්යයන්" යන අර්ථය යටතේ ගැනෙන මුදල් මණ්ඩලය විසින් සිය අභිමතය පරිදි සලකනු ලබන සියළුම අයදුම්පත්‍ය.

බැංකු පොළී අනුපාතය 1980 අප්‍රියෙල් මස සියයට 10 සිට සියයට 12 දක්වා වැඩි කරන ලද අවස්ථාවෙහිදී ප්‍රතිමූල්‍ය අනුපාතයන්ද සකසන ලදී. කෙසේ වෙතත් එවකට ක්‍රියාත්මක වෙමින් පැවති ණය ක්‍රමයනට මෙම නව පොළී අනුපාතිකයන් අදල නොවේ.

මෙහි පහත දැක්වෙන සටහනෙහි දැනට ක්‍රියාත්මක වන ප්‍රතිමූල්‍ය ක්‍රමයෙහි මූලික ලක්‍ෂණ සැකෙවින් දක්වා ඇත.

**2 · 3 සංඛ්‍යා සටහන**

**මධ්‍යම හා දීර්ඝකාලීන ප්‍රතිමූල්‍ය ආයෝජනය**

| කාණ්ඩය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය (මුළු ණය මුදලෙහි ප්‍රතිශතය) | ණය මුදලෙහි කාල සීමාව | ප්‍රතිමූල්‍ය ණය සඳහා වන පොළී ප්‍රමාණය % | ණය දෙන ආයතනයට දෙනු ලබන පරතරය % | ව්‍යාපෘතියෙහි මුළු වටිනාකම වෙනුවෙන් ව්‍යාපාරය විසින් දැරිය යුතු අවම දායක මුදල % |
|---|---|---|---|---|---|
| I .. | 100 | අවු. 3 – 15 | 8½ | 4 | 10 |
| II .. | 80 | අවු. 3 – 15 | 10 | 3 | 20 |
| III .. | 60 | අවු. 3 – 15 | 11 | 5 | 20 |
| IV .. | 60 | අවු. 3 – 15 | 13 | 5 | 20 |

1980 වර්‍ෂයෙහි දී හඳුන්වා දෙන ලද තවත් වෙනස්කමක් වූයේ මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදල යටතේ ආධාර ලැබීමට සුදුසුකම් ලබන ව්‍යාපෘතීන් තම ව්‍යාපාරවල කොටස් මහජනයා වෙත නිකුත් කළයුතු වීමය. මෙම කොන්දේසිය මුදල් මණ්ඩලය විසින් ස්ථාපිත කරනු ලැබුයේ ව්‍යාපාරයන්හි අයිතීන් පුළුල් කිරීමට උනන්දු කරවීම සහ රටෙහි කොටස් වෙළෙඳ පළ තවදුරටත් ක්‍රියාත්මක කරවීම අරමුණු කොට ගෙනය. මෙම මූලික අවශ්‍යතාවය II, III සහ IV වන කාණ්ඩ යටතේ ප්‍රතිමූල්‍ය ආධාර දෙන ලද රු. දශලක්‍ෂ 5 ඉක්මවූ සියළු ණය මුදල් වලට බලපානු ඇත. මෙම කොන්දේසියෙහි වගන්ති පහත දැක්වෙන සටහනෙහි සම්පිණ්ඩනය කොට ඇත.

**2 · 4 සංඛ්‍යා සටහන**

| බැංකු ණය මුදලෙහි ප්‍රමාණය | | නිකුත් කළයුතු අවම ප්‍රාග්ධනය (ව්‍යාපෘතියෙහි මුළු පිරිවැයෙහි ප්‍රතිශතය) | අයිතීන් පුළුල් කිරීම සඳහා කොටස් ප්‍රාග්ධනය නිකුත් කළයුතු කාලසීමාව (අවුරුදු) |
|---|---|---|---|
| ඉක්මවිය යුතු සීමාව | වැඩි නොවිය යුතු සීමාව | | |
| | 5,000,000 | — | — |
| 5,000,000 | 10,000,000 | 5 | 5 |
| 10,000,000 | 25,000,000 | 5 | 4 |
| 25,000,000 | 50,000,000 | 10 | 3 |
| වඩා වැඩි 50,000,000 | | 15 | 2 |

සුළු ණයකරුවන් වෙත වාණිජ බැංකු සහ අනෙකුත් ණය දෙන ආයතන විසින් දෙනු ලබන කුඩා ප්‍රමාණයේ එනම් රු. 50,000 සහ රු. 500,000 අතර වන ණය මුදල් සඳහා මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදලෙහි පහසුකම් යොදා ගැනීමේදී, ලේඛන කටයුතු සහ පිළිවෙත් වඩාත් ලිහිල් කරන ලදී. 1980 වර්ෂයේ අවසන් කාර්තුවෙහි දී මෙම වෙනස හඳුන්වා දීමත් සමග අරමුදලෙහි පහසුකම් සහ අනුග්‍රහයන් බැංකුව විසින් සුළු ණයකරුවන් වෙත පහසුවෙන් ලබාදීම ආරම්භ විය.

1979 වර්ෂයෙහිදී රු. දශ ලක්ෂ 41·3 ක ණය මුදල් සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් වශයෙන් දෙන ලද මුදල රු. දශ ලක්ෂ 30·9 ක්වූ අතර, 1980 වර්ෂයෙහිදී කාණ්ඩ III සහ IV ට අයත් වන රු. දශ ලක්ෂ 175 ක ණය මුදල් සඳහා රු. දශ ලක්ෂ 121·7 ක ප්‍රතිමූල්‍ය පහසුකම් ප්‍රදානය කරන ලදී.

ප්‍රතිමූල්‍ය වර්ගීකරණය කාර්යමය වශයෙන් පහත දැක්වේ.

**2 · 5 සංඛ්‍යා සටහන**

**1979/1980 අනුමැතිය ලත් මධ්‍යම හා දීර්ඝකාලීන ප්‍රතිමූල්‍ය ආයෝජන**

| ශී ර් ෂ | 1979 | | 1980 | |
|---|---|---|---|---|
| | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය |
| කෘෂිකර්මය .. | 1,050 | 1,050 | 1,085 | 685 |
| ධීවර කටයුතු .. | 1,751 | 1,751 | — | — |
| කර්මාන්ත .. | 38,101 | 27,683 | 62,084 | 48,919 |
| හෝටල් ව්‍යාපෘති .. | — | — | 51,953 | 36,105 |
| වෙනත් .. | 465 | 465 | 60,032 | 36,026 |
| එකතුව .. | 41,367 | 30,949 | 175,154 | 121,735 |

මෙම වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව පළමුවන කාණ්ඩය යටතේ ව්‍යාපෘතීන් 4 ක් සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැලසීම පිණිස රු. දශ ලක්ෂ 78 ක් දක්වා මුදල් ප්‍රමාණයක් වෙන් කරන ලදී. මීට අමතර වශයෙන් වර්ෂය ආරම්භයේදී ක්‍රියාත්මක වෙමින් පැවති අනෙකුත් ව්‍යාපෘතීන් 8 ක් සඳහා ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය පහසුකම් සැපයීම තවදුරටත් කරගෙන යනු ලැබීය. මෙම ව්‍යාපෘතීන් සඳහා වෙන්කරනු ලැබූ රු. දශ ලක්ෂ 258 න් 1980 වර්ෂය තුලදී රු. දශ ලක්ෂ 93 ක් ප්‍රයෝජනයට ගැනිණ. එක් එක් ව්‍යාපෘති-යක් සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය සහ ඒවා ප්‍රයෝජනයට ගන්නා ලද ආකාරය පහත සටහනෙහි දක්වේ.

ඉහත සංඛ්‍යාවන් අනුව ශ්‍රී ලංකා මහ බැංකුවෙන් දෙන ලද ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණ යෙහි සැලකිය යුතු වර්ධනයක් දක්නා ලදී. 3 වන සහ 4 වන කාණ්ඩයන් සඳහා ප්‍රදානය කරන ලද ප්‍රතිමූල්‍ය පහසුකම් විශේෂයෙන් සඳහන් කළ යුතුය. 1 වන කාණ්ඩය සම්බන්ධව බලන කල, වෙන්කරන ලද ප්‍රතිමූල්‍ය ප්‍රමාණය ප්‍රමාණවත් වුවද ධීවර යෝජනා ක්‍රමය හැරුන විට අනෙක් යෝජනා ක්‍රම සඳහා මෙම මුදල් යොද ගැනීමේ ප්‍රමාණය සතුටුදයක බව කිව නොහැක. කෙසේ වෙතත් මෙම යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ වූ සමහර බාධක මග හැරවීමට දැනටමත් කටයුතු කර ඇති බැවින් 1981 වර්ෂය තුලදී මෙම අරමුදල් යොද ගැනීමේ වර්ධනයක් දැකිය හැකි වෙතැයි අපේක්ෂා කෙරේ.

## 2·6 සංඛ්‍යා සටහන

### ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රතිමූල්‍ය ක්‍රමයෙහි 1 කාණ්ඩයට අයත්, අමාත්‍යාංශ අනුග්‍රහය ලද මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ණය යෝජනා ක්‍රම

| ව්‍යාපෘතියෙහි නම | ප්‍රතිමූල්‍ය වෙන් කිරීම රු. දශ ලක්ෂ | ප්‍රයෝජනයට ගත් මුදල රු. දශ ලක්ෂ | ප්‍රයෝජනයට නොගත් මුදල රු. දශ ලක්ෂ | ව්‍යාපෘතිය ඇරඹි දිනය | වෙන් කරන ලද මුදල් ප්‍රදානය කළයුතු කාලසීමාව අවුරුදු |
|---|---|---|---|---|---|
| **අ. 1980 වර්ෂය ආරම්භයේවූ ව්‍යාපෘතීන්** | | | | | |
| 1. සුළු ඔකිඩ් වගාකරුවන් සඳහා වන ණය ක්‍රමය (ලංකා බැංකුව) .. | 4·5 | 0·50 | 4·00 | 1979·04·03 | 3 |
| 2. පොල් පොහොර ණය ක්‍රමය (ලංකා බැංකුව, මහජන බැංකුව) .. | 30·00 | 7·85 | 22·15 | 1979·03·26 | 3 |
| 3. ධීවර අංශයේ බැංකු මූල්‍ය යෝජනා ක්‍රමය .. | 107·0 | 56·11 | 50·89 | 1979·07·02 | 3 |
| 4. වැව්, වාරිමාර්ග නවීකරණ යෝජනා ක්‍රමය .. .. | 7·76 | 7·70 | — | 1979·06·03 | 1 |
| 5. නුවරඑළිය දිස්ත්‍රික්කයේ කිරිපට්ටි සංවර්ධන යෝජනා ක්‍රමය (ලංකා බැංකුව, මහජන බැංකුව) .. .. | 10·00 | 1·00 | 9·00 | 1979·08·22 | 3 |
| 6. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඒකීකරන ග්‍රාම සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ පවත්වා ගෙන යන ගොවිපළ යන්ත්‍රෝප-කරන ණය ක්‍රමය (ලංකා බැංකුව, මහජන බැංකුව) .. .. | 40·00 | 15·00 | 25·00 | 1979·10·28 | 5 |
| 7. සමන්තුරේ ඡන්ද කොට්ඨාශයෙහි කිරිපට්ටි සංවර්ධනය සඳහා වන (මූලික) යෝජනා ක්‍රමය .. .. | 0·12 | — | 0·12 | 1979·11·27 | 3 |
| 8. මහවැලි පදිංචි කරුවන්ට ට්‍රැක්ටර් යන්ත්‍ර මිලදී ගැනීමට ආධාර කිරීම සඳහා වන යෝජනා ක්‍රමය .. .. | 55·0 | 5·00 | 50·00 | 1979·11·19 | 3 |
| **ආ. 1980 වර්ෂය තුළදී අනුමත කරන ලද යෝජනා ක්‍රම** | | | | | |
| 9. මිරිදිය ධීවර කර්මාන්තය සඳහා වන මූල්‍ය යෝජනා ක්‍රමය .. | 5·2 | – | 5·2 | 1980·08·29 | 2 |
| 10. විවිධ සේවා සමුපකාර සමිති මගින් පොහොර ගබඩා තැනීම සඳහා වන ණය ක්‍රමය .. .. | 11·5 | — | 11·5 | 1980·10·13 | 1 |
| 11. අබුඩාබි අරමුදලෙන් ආරම්භ කොට ඇති වයඹ මුහුදුබඩ ධීවර සංවර්ධන යෝජනා ක්‍රමය (ලංකා බැංකුව, මහජන බැංකුව) .. | 60·0 | — | 60·0 | 1980·10·13 | 3 |
| 12. මහජන බැංකුව/සර්වෝදය ව්‍යාපාරය/ලක්මල්සල මගින් මෙහෙයවනු ලබන ඔකිඩ් වගා ණය ක්‍රමය .. .. | 3·0 | — | 3·0 | 1980·12·10 | 5 |
| එකතුව .. .. | 334·02 | 93·16 | 240·86 | | |

## සුළු කර්මාන්ත ව්‍යාපෘතීන් සඳහා වන ණය සහතික ක්‍රමය

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සහාය ඇතිව ලංකා බැංකුව, මහජන බැංකුව සහ සංවර්ධන මූල්‍ය සංස්ථාව විසින් සුළු පරිමානයේ කර්මාන්ත යෝජනා ක්‍රම සඳහා දෙනු ලබන ණය ආවරණිත ''සුළු පරිමාණ කර්මාන්ත ව්‍යාපෘති සඳහා වූ ණය සහතික ආවරන ක්‍රමය'' තවදුරටත් පවත්වාගෙන යන ලදී. ''සුළු සහ මධ්‍ය පරිමාණ ණය සහතික ක්‍රමය'' හඳුන්වා දීමත් සමග සුළු පරිමාණ කර්මාන්ත ණය සහතික ක්‍රමය යටතේ වූ ණය අයදුම් පත් සංඛ්‍යාවෙහි සැලකිය යුතු පහත වැටීමක් දක්නා ලදී. මෙම වර්ධනයට හේතුවූයේ සහභාගි වූ ණය දෙන ආයතන එනම් මහජන බැංකුව, ලංකා බැංකුව සහ සංවර්ධන මූල්‍ය සංස්ථාව නව ක්‍රමය යටතේ සහතික ආවරන ලැබීමට වඩාත් කැමැත්තක් දක්වීමය. 1980 මැද භාගය වන විට සුළු පරිමාන කර්මාන්ත ණය සහතික ක්‍රමය යටතේ අළුත් අයදුම්පත් දක්නට නොවීය. එහෙත් සහතික ආවරනය දෙන ලද ණය මුදල් ගෙවා අවසන් වනතුරු හෝ බැංකු විසින් ණය සහතික සඳහා ඉදිරිපත් කරන තුරු හෝ ඇප ආදේශයන් ගෙවා නිමවන තෙක් මෙම සහතික ක්‍රමය දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් පවත්වා ගෙන යනු ඇත. ආධාර සපයන ලද කර්මාන්ත අනුව වර්ගීකරණය කරන ලද ණය සහතික වල සංක්ෂිප්ත සටහනක් 2·7 සංඛ්‍යා සටහනින් දක්වේ.

**2·7 සංඛ්‍යා සටහන**

**සුළු පරිමාණ ණය සහතික ක්‍රමය 1978 – 1980**

| කර්මාන්තය | ණය සංඛ්‍යාව | | | මුදල (රුපියල්) | | |
|---|---|---|---|---|---|---|
| | 1978 | 1979 | 1980 | 1978 | 1979 | 1980 |
| 1· වී කෙටීම | 2 | 51 | 36 | 202,000 | 6,327,045 | 4,807,875 |
| 2· ලුහු ඉංජිනේරු | 15 | 101 | 5 | 379,065 | 3,706,997 | 287,723 |
| 3· ගඩොල් සහ අනෙකුත් ගොඩ-නැගිලි ද්‍රව්‍ය | 13 | 171 | 57 | 68,700 | 1,304,250 | 2,753,126 |
| 4· නිමි ඇඳුම්, බතික්, අත්යන්ත්‍ර රෙදිපිළි, බුමුතුරුණු ආදිය | 10 | 40 | 3 | 201,380 | 952,799 | 20,975 |
| 5· රබර් උපයෝගී කර නිපයන භාණ්ඩ | 3 | 9 | 10 | 163,920 | 145,567 | 1,076,415 |
| 6· පාවහන් සහ අනෙකුත් සම් භාණ්ඩ | 2 | 7 | 1 | 16,500 | 216,150 | 604,250 |
| 7· හකුරු සහ උක් භාවිතා කොට කෙරෙන අනෙකුත් නිෂ්පාදන | 14 | 6 | 7 | 447,775 | 109,047 | 330,060 |
| 8· ලී බඩු සහ අනෙකුත් ගෘහභාණ්ඩ | 6 | 11 | 5 | 70,606 | 229,940 | 709,340 |
| 9· කොහු සහ කොහු ආශ්‍රිත නිෂ්-පාදන | 3 | 14 | 27 | 102,245 | 352,465 | 1,238,868 |
| 10· ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් කඩදාසි නිෂ්පාදන | 3 | 12 | 7 | 52,689 | 413,358 | 165,488 |
| 11· ආහාර හා පාන වර්ග | 1 | 8 | 1 | 7,000 | 282,850 | 269,420 |
| 12· එළවළු තෙල් නිෂ්පාදනය | 1 | 5 | 2 | 40,000 | 88,910 | 77,175 |
| 13· තීන්ත, පොලිෂ්, වාර්නිෂ් වැනි දෑ | — | 3 | — | — | 209,600 | — |
| 14· ගුවන් විදුලි යන්ත්‍ර, බයිසිකල් ආදිය සඳහා අමතර කොටස් | 5 | 13 | 1 | 133,180 | 816,792 | 35,094 |
| 15· සබන් හා අනෙක් ප්‍රසාධන භාණ්ඩ | 2 | 22 | 3 | 21,800 | 295,775 | 79,180 |
| 16· හස්ත කර්මාන්ත හා ක්‍රීඩා භාණ්ඩ | — | 16 | 3 | — | 184,830 | 7,777 |
| 17· සුරුට්ටු සහ බීඩි නිෂ්පාදන | 1 | 5 | 1 | 8,000 | 32,500 | 2,700 |
| 18· ධීවර යාත්‍රා සහ මිරිදිය ධීවර කටයුතු | 1 | 2 | — | 16,200 | 11,000 | — |
| 19· ස්වර්ණාභරණ හා මැණික් | 2 | 4 | 1 | 12,110 | 56,850 | 18,175 |
| 20· වෙනත් දෑ | 2 | 6 | 2 | 67,240 | 385,917 | 15,823 |
| එකතුව | 86 | 506 | 172 | (අ) 2,010,410 | (ආ) 161,22,642 | (ඇ) 12,499,464 |

(අ) රු. 104,256 ක් වටිනා අලෙවි ණය 7 ක් ඇතුලත් වේ.
(ආ) රු. 167,862 ක් වටිනා අලෙවි ණය 14 ක් ඇතුලත් වේ.
(ඇ) රු. 89,871 ක් වටිනා අලෙවි ණය 4 ක් ඇතුලත් වේ.

## සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය සහතික ක්‍රමය

ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන බැංකුව (ජාසබැ) සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ක්‍රමය (සුමක) යටතේ දෙනු ලබන ණය ආවරණය කිරීම පිණිස ණය සහතික ක්‍රමයක් සථාපනය කිරීම මුදල් නීති පනතේ 108 අ වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඇත. මෙම ණය ක්‍රමය සඳහා ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (අයිඩීඒ) ශ්‍රී ලංකා රජය මගින් ඇ.එ.ජ. ඩොලර් දශ ලක්ෂ 16.0 ක ණයක් ලබා දී ඇත. මෙම මුදලින් ඇ.එ.ජ. ඩොලර් දශලක්ෂ 12 ක් රටෙහි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා වෙන්කරනු ලැබ ඇත. මෙම ණය සහතික ක්‍රමයට සහභාගී වන ආයතන නම් මහජන බැංකුව, ලංකා බැංකුව, සංවර්ධන මූල්‍ය සංස්ථාව සහ හැටන් නැෂනල් බැංකුවත්ය. මෙම ආයතන මගින් දෙනු ලබන අරමුදලින් ජාතික සංවර්ධන බැංකුව විසින් ප්‍රතිමූල්‍ය කරණය කෙරෙන අතර ශ්‍රී ලංකා මහ බැකුව මගින් මෙම ණය මුදල් ආවරණය කෙරෙන ණය සහතික නිකුත් කරනු ලැබේ. මෙම ක්‍රමය යටතේ සහතික නිකුත් කෙරෙන උපරිම ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1 ක් වන අතර නිකුත් කරනු ලබන උපරිම සහතික ආවරණය ණය මුදලින් සියයට 60 කට හෝ රු 400,000 යන දෙකින් අඩු ප්‍රමාණයට සීමා විය යුතුය. 1980 දෙසැම්බර් 31 වන දිනට රු. දශ ලක්ෂ 65·7 ක් වටිනා ණය මුදල් 626 ක් මෙම ක්‍රමය යටතේ ආවරණය ලදහ. පහත දැක්වෙන ලේඛනය මගින් ආවරණය ලද ණය මුදල් වල කර්මාන්ත අනුව කරන ලද, වර්ගීකරණයක් පෙන්නුම් කරයි.

### 2 · 8 සංඛ්‍යා සටහන

### 1980 දී නිකුත් කරන ලද සුළු හා මධ්‍යම කර්මාන්ත ණය ඇපකර

| කර්මාන්තය | ණය මුදල් සංඛ්‍යාව | මුදල් ප්‍රමාණය (රු.) |
|---|---|---|
| 1· වී කෙටීම | 98 | 11,946,790 |
| 2· ලුහු ඉංජිනේරු | 62 | 6,862,140 |
| 3· ගඩොල් සහ අනෙක් ගොඩනැගිලි ද්‍රව්‍ය | 130 | 15,245,560 |
| 4· නිම් ඇඳුම්, බතික්, අත්යන්ත්‍ර රෙදි, බුමුතුරුණු ආදිය | 67 | 5,357,160 |
| 5· රබර් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන | 9 | 768,160 |
| 6· පාවහන් සහ අනෙකුත් සම් භාණ්ඩ | 11 | 728,630 |
| 7· හකුරු සහ අනෙකුත් උක් නිෂ්පාදන | 1 | 29,000 |
| 8· ගෘහභාණ්ඩ සහ අනෙකුත් ලී බඩු | 41 | 4,692,033 |
| 9· කොහු සහ කොහු ආශ්‍රිත නිෂ්පාදන | 55 | 4,207,685 |
| 10· ලිපි ද්‍රව්‍ය සහ අනෙකුත් කඩදසි නිෂ්පාදන | 22 | 3,848,560 |
| 11· ආහාර පාන වර්ග නිෂ්පාදනය | 33 | 2,934,235 |
| 12· තීන්ත,පොලිෂ් සහ වාර්නිෂ් වර්ග | 2 | 600,000 |
| 13· ගුවන් විදුලි සහ බයිසිකල් සඳහා අමතර කොටස් | 8 | 243,815 |
| 14· සබන් සහ විලවුන් නිෂ්පාදනය | 10 | 320,585 |
| 15· හස්ත කර්මාන්ත සහ සෙල්ලම් බඩු | 9 | 412,225 |
| 16· සුරුට්ටු සහ බීඩි නිෂ්පාදනය | 3 | 20,500 |
| 17· ධීවර යාත්‍රා සහ මිරිදිය ධීවර කටයුතු | 7 | 2,091,650 |
| 18· ස්වර්ණාභරණ සහ මැණික් | 2 | 208,000 |
| 19· ක්‍රීඩා භාණ්ඩ නිෂ්පාදනය | 1 | 65,000 |
| 20· කෘෂිකාර්මික නිෂ්පාදන | 2 | 420,000 |
| 21· වීදුරු සහ වෙනත් වීදුරු නිෂ්පාදන | 4 | 489,580 |
| 22· පිත්තල සහ ඇළුමිනියම් භාණ්ඩ | 31 | 2,120,468 |
| 23· අනෙකුත් දෑ | 18 | 2,124,550 |
| එකතුව | 626 | 65,736,326 |

මාතර ශාඛාව

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මාතර ශාඛාව පිහිටුවීමෙන් පසු දෙපාර්තමේන්තුව වැදගත් කාර්‍ය භාරයක් පැවරෙනු ඇත. මේ සම්බන්ධයෙන් මාතර දිස්ත්‍රික්කයෙහි කෘෂි කාර්මික හා කුඩා කර්මාන්ත සංවර්ධනය සඳහා වන මූල්‍ය අවශ්‍යතා පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධ්‍යයනයක් කරන ලදුව එම දිස්ත්‍රික්කයෙහි රැකියා විරහිත තරුණයන්ට සුළු කර්මාන්ත ඇරඹීමට උනන්දු කරවීම පිණිස ණය ක්‍රමයක් සකසන ලදී. මාතර ශාඛාව පිහිටුවීමෙන් පසු මෙම කාර්යය එම ශාඛාව මගින් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය

ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර ඇතිව පිහිටුවනලද ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයෙහි මූලික පිළියෙල කිරීම් කටයුතු වලදී දෙපාර්තමේන්තුව උද්‍යොගිමත්ව කටයුතු කරන ලදී. මෙයට

1. දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලියට ග්‍රාමීය ණය හා සම්බන්ධ කාර්යයන් එක් කරමින් එහි කාර්ය භාරය වඩාත් පුළුල් කිරීම;

2. ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලය පිහිටුවීම;

3. වාණිජ බැංකු නිලධරයන්ට ග්‍රාමීය ණය කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා දීම් වස් ග්‍රාමීය ණය අභ්‍යාස ආයතනයක් පිහිටුවීම;

4. ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් යොදා ගනිමින් ට්‍රැක්ටර්, බලවේගී ඉසුරුම් යන්ත්‍ර, වතුර පොම්ප යනාදිය සඳහා මූල්‍ය පහසුකම් සැලසීම; සුළු ගොවියන්ට මීහරකුන් ලබාදීම, රටෙහි සමහර ප්‍රදේශවල ළිං කැණීම සහ නළ ළිං සවිකිරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කිරීමත් සහ

5. ග්‍රාමීය ණය ප්‍රතිපත්ති වල සියළු කරුණු සම්බන්ධයෙන්ම තීරණ ගැනීමේදී උපකාරී වන මනා ලෙස සංවිධිත පර්යේෂණ වැඩ සටහනක් සැකසීම භාරගැනීමත් අයත් වේ.

හඳුන්වා දෙන ලද වෙනස්කම්වල ප්‍රතිඵලයක් වශයෙන් 1980 වර්ෂයෙහි දී දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලියෙහි නව ප්‍රභවයක් ඇතිවූ බව දක්නා ලදී. මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීමට බලාපොරොත්තු වන විශේෂඥයන්ගේ සහාය ද ඇතිව ග්‍රාමීය ණය විෂය ක්ෂේත්‍රයෙහි කාර්යයන් වඩාත් වර්ධනය වනු ඇත.

රාජ්‍ය ණය

වර්ෂය තුළදී දළ රාජ්‍ය ණය ප්‍රමාණය රු. 16,180,907,054 කින් වැඩි වූ අතර මුදල් වර්ෂය අවසානයේදී දළ රාජ්‍ය ණය ප්‍රමාණය රු. 51,655,656,319 ක්ව පැවතියේය. දේශීය ණය ප්‍රමාණයෙහි වැඩිවීම රු. 9,744,717,957 ක් වූ අතර විදේශීය ණය ප්‍රමාණයෙහි වැඩිවීම රු. 6,436,189,097 ක් විය. දළ රාජ්‍ය ණය ප්‍රමාණයෙහි වැඩි වීම ප්‍රධාන වශයෙන්ම සැදුම් ලද්දේ භාණ්ඩාගාර බිල්පත්, රුපියල් ණය, මහ බැංකු අත්තිකාරම්, විශේෂ ණය හා විදේශීය ණය ප්‍රමාණයන්හි වැඩි වීම් වලිනි. පරිපාලනමය ණය ගැනුම් හා බදු සංචිත සහතික අඩුවීම් පෙන්නුම් කළේය. රාජ්‍ය ණයෙහි සංයුතිය 2.9 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**2 . 9 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය ණයෙහි සංයුතිය – 1979 හා 1980**

| ශීර්ෂය | වර්ෂාවසානයට ශේෂය | | වර්ෂය තුළ වැඩි වීම හෝ අඩුවීම (රු.) |
|---|---|---|---|
| | 1979 | 1980 | |
| 1. දේශීය ණය .. | 19,634,127,737 | 29,378,845,694 | +9,744,717,957 |
| 1.1 දීර්ඝකාලීන ණය: .. | 15,469,581,462 | 17,938,682,557 | +2,469,101,095 |
| (අ) රුපියල් ණය .. | 14,929,061,600 | 17,610,978,400 | +2,681,916,800 |
| (ආ) පරිපාලන ණය ගැනීම් .. | 540,446,023 | 327,630,318 | − 212,815,705 |
| (ඇ) ජාතික සංවර්ධන තිළිනපත් .. | 73,839 | 73,839 | — |
| 1.2 කෙටිකාලීන ණය: .. | 4,164,546,275 | 11,440,163,137 | +7,275,616,862 |
| (අ) භාණ්ඩාගාර බිල්පත් .. | 3,000,000,000 | 9,800,000,000 | +6,800,000,000 |
| (ආ) බදු සංචිත සහතික .. | 28,046,275 | 12,525,327 | − 15,520,948 |
| (ඇ) මහ බැංකු අත්තිකාරම් .. | 1,136,500,000 | 1,319,200,000 | + 182,700,000 |
| (ඈ) විශේෂ ණය .. | — | 308,437,810 | + 308,437,810 |
| 2. විදේශීය ණය .. | 15,840,621,528 | 22,276,810,625 | +6,436,189,097 |
| 2.1 යෝජනා ක්‍රම ණය .. | 5,569,534,723 | 6,784,273,556 | +1,214,738,833 |
| 2.2 ද්‍රව්‍යාධාර ණය .. | 8,900,894,901 | 11,791,107,159 | +2,890,212,258 |
| 2.3 වෙනත් ණය .. | 1,370,191,904 | 3,701,429,910 | +2,331,238,006 |
| මුළු රාජ්‍ය ණය .. | 35,474,749,265 | 51,655,656,319 | +16,180,907,054 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

**දේශීය ණය ගැනීම්**

**(අ) රුපියල් ණය**

1980 මුදල් වර්ෂය සඳහා වූ රජයේ අයවැය වැඩපිළිවෙලට අනුව දේශීය බැංකු නොවන මූලයන්ගෙන් රුපියල් දශ ලක්ෂ 3,100 ක් ලබා ගැනීමට බලාපොරොත්තු වූ අතර, 1979 මුදල් වර්ෂයේදී දේශීය බැංකු නොවන මූලයන්ගෙන් රුපියල් දශ ලක්ෂ 2,950 ක් ලබා ගන්නා ලදී. 1980 වර්ෂයේ මුල් භාගය තුළදී එකක් රුපියල් දශ ලක්ෂ 400 බැගින් වූ ණය මුදල් හතරක් ආරම්භ කරන ලදී කල් පිරීමේ කාලසීමාව අවුරුදු 10—12 දක්වා වූ මෙම ණය මුදල් සඳහා සියයට 10 ක වාර්ෂික පොළියක් ගෙවනු ලැබිණ.

රුපියල් ණය සඳහා වූ කල් පිරීමේ කාල සීමාව වසර 3 දක්වා අඩු කර වාර්ෂික පොළිය සියයට 16 දක්වා වැඩි කිරීමට 1980 අප්‍රේල් මාසයේදී රජය විසින් තීරණය කරන ලදී. මේ අනුව 1980 ජූලි මාසයේ සිට ආරම්භ කරන ලද සියළුම ණය මුදල් වසර 3 ක කල් පිරීමේ කාල සීමාවක් සඳහා වූ අතර වාර්ෂික පොළී අනුපාතිකය සියයට 16 ක් විය. නිදන් අරමුදල් දායක දීමනාවන්ගෙන් මෙම ණය මුදල් වෙනුවෙන් වාර්ෂික වෙන් කිරීම වසරකට සියයට 5 සිට සියයට 35½ දක්වා වැඩිකරන ලදී. 1980 වර්ෂය තුළදී රුපියල් ණය මගින් ලබා ගන්නා ලද සම්පූර්ණ මුදල රුපියල් දශ ලක්ෂ 2,801.5 ක් විය. සියළුම රුපියල් ණය ලබාගෙන ඇත්තේ 1979 අංක 71 දරන විසර්ජන පනත යටතේය.

රුපියල් ණය සඳහා ප්‍රධාන වශයෙන් දායක වූයේ ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ඒකාබද්ධ ආයෝජන අරමුදල හා සේවක අර්ථ සාධක අරමුදලත්ය. රුපියල් ණය වැඩ පිළිවෙලට අමතරව රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 100 ක ණයකරයක් ආරම්භ කරනු ලැබිණ. මෙම ණයකරය සඳහා සේවක අර්ථ සාධක අරමුදල රුපියල් දශ ලක්ෂ 35.7 කින් දායක වූ අතර ශේෂය සඳහා දායක වූයේ ඒකාබද්ධ ආයෝජන අරමුදලයි. 1979 වර්ෂය සමග සසඳා බැලීමේදී 1980 වර්ෂය තුළ නිදන් අරමුදල හා සේවක අර්ථසාධක අරමුදල රුපියල් ණය වෙනුවෙන් යෙදවුනු සිය ආයෝජනයන්ගේ වර්ධනයක් පෙන්නුම් කර ඇති බවත්, ජාතික ඉතිරි කිරීමේ බැංකුව හා රක්ෂණ සංස්ථාව සිය දායකවීම්වල අඩුවීමක් පෙන්නුම් කර ඇති බවත් පැහැදිලි වේ.

මෙම වර්ෂය තුළ රු. 119,583 200.00 ක රුපියල් ණය මුදල් පහක් කල් පිරුන අතර අදාළ නිදන් අරමුදල්හි වූ මුදල් උපයෝගි කර ගනිමින් මෙකී ණය මුදල් ආපසු ගෙවන ලදී. නිදන් අරමුදල්වල තිබූ අතිරික්තය වන රු. 19,005,5605.5 ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී. 1980 වර්ෂය තුළ රුපියල් ණය වෙනුවෙන් වූ වගකීම්වල ශුද්ධ වැඩිවීම රු. 2,681,916,800 ක් විය.

(ආ) නිදන් අරමුදල්

1980 මුදල් වර්ෂය අවසානය වන විට රුපියල් ණය බේරුම් කිරීම් සඳහා ස්ථාපිත නිදන් අරමුදල්වල වටිනාකම රු. 4,876,627,663.27 ක් විය. මෙය වර්ෂය තුළ රු. 913,731,601.89 ක වැඩි වීමක් පෙන්නුම් කරයි.

මෙම වැඩිවීම පහත සඳහන් අන්දමට සෑදී ඇත:

| | | | |
|---|---|---|---|
| 1. 1980 වර්ෂය තුළ නිදන් අරමුදල් දායක දීමනා: | රු. | 631,064,358.50 | |
| 2. ආයෝජන සඳහා වූ පොළිය : | රු. | 421,256 003 94 | |
| එකතුව : | රු. | 1,052,320,362.44 | |
| අඩු කරන්න : | | | |
| 1. 1980 වර්ෂය තුළ ආපසු ගෙවීම් සඳහා උපයෝගි කොටගත් මුදල : | රු. | 119,583,200.00 | |
| 2. 1980 වර්ෂය තුළ ඒකාබද්ධ අරමුදලට බැර කළ අතිරික්තය: | රු. | 19,005,560.55 | රු. 138,588,760 55 |
| 1980 වර්ෂය තුළ ශුද්ධ වැඩි වීම | | | රු. 913,731,601.89 |

(ඇ) පරිපාලන ණය ගැනීම

මහ බැංකුව මාර්ගයෙන් රජයට ලබා දී ඇති ණය මුදල් තුනක් රාජ්‍ය ණය යටතේ කෙරෙන පරිපාලන ණය ගැනීම් යටතේ වර්ගීකරණය කර ඇත. මෙම වර්ගය යටතේ ගැණුන ඉරාන ණය මුදල 1980 වර්ෂය අවසානයේදී සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරන ලදී. වර්ෂය අවසානය වනවිට පරිපාලන ණය ගැනීම් වෙනුවෙන් වූ සම්පූර්ණ රුපියල් වගකීම රු. 327,630,318 ක් විය.

(ඈ) භාණ්ඩාගාර බිල්පත්

1976. 11. 26 වැනි දින ජාතික රාජ්‍ය සභාවේ යෝජනාවක් අනුව රුපියල් දශ ලක්ෂ 3,000 දක්වා වැඩි කරන ලද රජයේ භාණ්ඩාගාර බිල්පත් අනුදත් සීමාව මෙම වර්ෂය තුළදී වාර හතරක් සංශෝධනය කරන ලදී. එක් එක් සංශෝධනයෙන් පසුව අනුදත් සීමාව සංශෝධනය කෙරුන දිනයද සහිතව පහතින් දක්වා ඇත.

| සංශෝධනය කරන ලද දිනය | වැඩි කරන ලද මුදල රුපියල් දශ ලක්ෂ | නව උපරිම සීමාව රුපියල් දශ ලක්ෂ |
|---|---|---|
| 1. 1980-03-06 | 1,000.0 | 4,000.0 |
| 2. 1980-07-10 | 2,000.0 | 6,000.0 |
| 3. 1980-10-17 | 2,000.0 | 8,000.0 |
| 4. 1980-12-01 | 2,000.0 | 10,000.0 |

වර්ෂය අවසානය වන විට නිකුත් කර, නොගෙවා ඉතිරිව ඇති භාණ්ඩාගාර බිල්පත්වල සම්පූර්ණ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 9,800 ක් වූ අතර මෙය වර්ෂය තුළ රුපියල් දශ ලක්ෂ 6,800 ක වැඩිවීමක් පිළිබිඹු කරයි. බැංකු අංශය විසින් රුපියල් දශ ලක්ෂ 9,612.5 ක භාණ්ඩාගාර බිල්පත් දරනු ලැබූ අතර මේ සඳහා මහ බැංකුවේ දායක වීම රුපියල් දශ ලක්ෂ 9,604 5 ක් විය. 1980 වර්ෂය අවසානයේදී භාණ්ඩාගාර බිල්පත් අයිතිය පිළිබඳ වර්ගීකරණයක් 2·10 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ වාර්ෂික පොළී අනුපාතිකය වර්ෂය තුළදී සියයට 9 සිට සියයට 13 දක්වා වැඩි කරන ලදී.

**2 . 10 සංඛ්‍යා සටහන**

**1979 සහ 1980 භාණ්ඩාගාර බිල්පත් හිමිකම**

| හිමිකරුවෝ | 1979 | | 1980 | |
|---|---|---|---|---|
| | මුදල (රු. දශලක්ෂ) | ප්‍රතිශතය | මුදල (රු. දශලක්ෂ) | ප්‍රතිශතය |
| 1. බැංකු අංශය .. | 2,706·4 | 90·2 | 9,612·5 | 98·1 |
| 1·1 මහ බැංකුව .. | 2,656·4 | 88·5 | 9,604·5 | 98·0 |
| 1·2 වෙළෙඳ බැංකු .. | 50·0 | 1·7 | 8·0 | 0·1 |
| 2. බැංකු නොවන අංශය .. | 293·6 | 9·8 | 187·5 | 1·9 |
| 2·1 සේවක අර්ථසාධක අරමුදල .. | 18·4 | 0·6 | 1·5 | ... |
| 2·2 වෙනත් අර්ථසාධක අරමුදල් .. | 3·5 | 0·1 | 6·3 | 0·1 |
| 2·3 ඉතුරුම් ආයතන .. | 99·0 | 3·3 | — | — |
| 2·4 රක්ෂණ සමාගම් .. | 4·0 | 0·1 | 4·0 | ... |
| 2·5 දෙපාර්තමේන්තු සහ වෙනත් නිල අරමුදල් .. | 168·5 | 5·6 | 175·5 | 1·8 |
| 2·6 අනෙකුත් .. | 0·2 | ... | 0·2 | ... |
| එකතුව .. | 3,000·0 | 100·0 | 9,800·0 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**(ඉ) බදු සංචිත සහතිකපත්**

**1977 වර්ෂයෙහි රුපියල් දශ ලක්ෂ 750 දක්වා වැඩි කරන ලද බදු සංචිත සහතික පත් නිකුතුව සම්බන්ධයෙන් වූ අනුදත් සීමාව මෙම වර්ෂය තුළදීද නොවෙනස්ව පැවතිණි. 1980 වර්ෂය අවසානය දක්වා නිකුත් කරන ලද බදු සංචිත සහතික පත්වල එකතුව රු. 737,601,100 ක් විය. මෙම ප්‍රමාණයෙන් රු. 725,075,773 ක් සඳහා වූ සහතික පත් ගෙවීම් සඳහා ඉදිරිපත් කර ඇති අතර නොපියවා ඇති ප්‍රමාණය රු. 12,525,327 ක් වේ. 1979 වර්ෂය අවසානයේ පැවති මට්ටම හා සසඳා බැලීමේදී මෙය වර්ෂය තුළ රු. 15,520,948 ක අඩුවීමක් පිළිබිඹු කරයි.**

**(ඊ) මහ බැංකු අත්තිකාරම්**

**මහ බැංකුව රජයට සැපයූ තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය වර්ෂය තුළදී රු. 182,700,000 කින් වැඩි වූ අතර වර්ෂය අවසානයේදී නොපියවූ මුළු වගකීම් ප්‍රමාණය රු. 1,319,200,000 ක් විය. වර්ෂය තුළදී රජය විසින් රු. 308,437,810 සඳහා විශේෂ ණය ලබා ගන්නා ලදී. 1978 වර්ෂය අවසානය වනවිට, 1959 වර්ෂය තුළ ලබාගන්නා ලද විශේෂ ණය මුදල් සම්පූර්ණයෙන් පියවන ලද හෙයින් පෙර කියන ලද විශේෂ ණය මුදල් වෙනුවෙන් වූ නොපියවා ඇති සම්පූර්ණ වගකීම රු. 308,437,810 ක් විය.**

**විදේශීය ණය**

**1980 වර්ෂය අවසානය වනවිට පරිපාලන ණය හැරුණ විට අනෙකුත් නොපියවූ විදේශීය ණයවල මුළු එකතුව රු. 22,276,810,625 ක් විය. මෙය වර්ෂය තුළ රු. 6,436,189,097 ක වැඩිවීමක් පිළිබිඹු කරයි. විදේශීය ණය මුදල, රු.6,784,273,556 ක ව්‍යාපෘති ණයවලින්ද, රු. 11,791,107,159 ක ද්‍රව්‍යාධාර ණය වලින්ද, රු. 3,701,429,910 ක අනෙකුත් ණයවලින්ද සමන්විත විය. 1980 වර්ෂය තුළ විදේශීය ණය යටතේ වාර්තාවූ මුදා හැරීම් රු. 4,241,012,185 ක් විය. මෙම මුදලින් රු. 125,139,436 ක් වීන ණය වෙනුවෙන් වූ වැඩි කිරීම නිසා උද්ගත වූවක් විය. රාජ්‍ය ණය යටතේ සේවා කරනු ලබන විදේශීය ණය වැඩි කොටසක් විවිධ විදේශීය ව්‍යවහාර මුදල්වලින් දක්වන ලද අතර සෑම මාසයකම**

අවසානයේදී නොපියවා ඇති විදේශීය ව්‍යවහාර මුදල් ශේෂයන් විනිමය අනුපාතිකයන්ගේ වෙනස්වීම් අනුව ප්‍රතිප්‍රමාණ කරනු ලැබේ. 1980 වර්ෂය තුළ කැරුන සියළුම විනිමය අනු-පාතිකයන්ගේ සංශෝධන හේතුවෙන් ඇති වූ විදේශීය ණය වගකීම්වල ශුද්ධ වෙනස, විදේශීය ණය වගකීම රු. 2,796,250,125 කින් වැඩි කිරීමට සමත් විය. 1980 මුදල් වර්-ෂය තුළදී විදේශීය ණය ගිවිසුම් තිස් හතරක් අත්සන් කරන ලදී. 1978 සහ 1979 යන වර්ෂවල ගිවිසුම් අත්සන් කරන ලද නමුදු විදේශීය ණය දහයක් වෙනුවෙන් මුදල් ලබා ගැනීම ආරම්භ නොකරන ලදී. 1980 වර්ෂය තුළදී විදේශීය ණය පරිහරණ අනුපාතික යන් පහත මට්ටමක තිබුන අතර මෙය විශේෂයෙන්ම සංවර්ධන යෝජනා ක්‍රම වෙනුවෙන් ලැබුනු ණය සම්බන්ධයෙන් පහත වැටී තිබුණි.

### පොළී ගෙවීම්

1980 වර්ෂය තුළ රාජ්‍ය ණය උදෙසා ගෙවන ලද පොළිය රු. 2,199,949,602 ක් විය. මෙය 1979 වර්ෂයට වඩා රු. 566,336,042 ක වැඩි වීමක් පිළිබිඹු කරයි. එක් එක් වර්-ගය යටතේ ගෙවන ලද පොළී පිළිබඳ විස්තර 2·11 සංඛ්‍යා සටහනෙහි දී ඇත.

### අර්ධ රාජ්‍ය ආයතන මගින් ණය ගැනීම්

(අ) ජාතික නිවාස ණයකර

වර්ෂය තුළදී රු. 5,000,000 වටිනා ජාතික නිවාස ණයකර බේරුම් කරන ලදී. නිකුත් කරනු ලැබ, 1980 වර්ෂය අවසානය වන විට ඉතිරිව තිබූ ණයකරවල වටිනාකම රුපියල් 76,000,000 ක් විය. මෙකී ණයකර බේරීම සඳහා පිහිටුවනු ලැබූ නිදන් අර මුදලේ දළ වෙළෙඳ වටිනාකම රුපියල් 51,416,846 ක් වූ අතර වර්ෂය තුළදී මෙය රුපියල් 5,746,029 ක වැඩිවීමක් පෙන්නුම් කළේය.

(ආ) නාගරික සංවර්ධන අධිකාරියේ ණයකර

1980 වර්ෂය තුළදී රුපියල් 100,000,000 වටිනා නාගරික සංවර්ධන අධිකාරියේ ණයකර නිකුත් කරන ලදී. අවුරුදු 3 ක කාලයකින් කල් පිරෙන මෙම ණයකර සඳහා වාර්ෂිකව සියයට 16 පොළියක් ගෙවනු ලැබේ.

(ඇ) රාජ්‍ය උකස් බැංකු සහ ආයෝජන බැංකු ණයකර

1980 වර්ෂය තුළදී රාජ්‍ය උකස් බැංකු සහ ආයෝජන බැංකු ණයකර සම්බන්ධ යෙන් ගනුදෙනුවක් සිදු නොකරන ලදී. නිකුත් කරනු ලැබ, 1980 වර්ෂය අවසානය වන විට ගෙවීමට ඉතිරිව තිබූ ණයකරවල වටිනාකම රුපියල් 47,250,000 ක් විය.

**2 · 11 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය ණය මත පොළී ගෙවීම(අ)**

රුපියල්

| ණය වර්ගය | 1979 | 1980 |
|---|---|---|
| 1· දේශීය ණය .. .. | 1,276,933,248 | 1,787,420,819 |
| 1·1 රාජ්‍ය ණය .. .. | 1,028,678,106 | 1,330,288,692 |
| 1·2 පරිපාලන ණය ගැනීම්(ආ) .. .. | 27,552,069 | 15,344,501 |
| 1·3 භාණ්ඩාගාර බිල්පත් .. .. | 220,050,000 | 441,282,750 |
| 1·4 බදු සංචිත සහතිකපත් .. .. | 653,073 | 504,876 |
| 2· විදේශීය ණය . .. | 356,680,312 | 412,528,783 |
| එකතුව .. .. | 1,633,613,560 | 2,199,949,602 |

(අ) තාවකාලික රුපියල් ණය සහ භාණ්ඩාගාරය විසින් සේවා කරන කෙටිකාලීන විදේශීය ණය මත පොළී ගෙවීම් මීට ඇතුළත් නොවේ.

(ආ) ඒඑල් 556, කේඑෆ්ඩබ්ලිව් සහ ඉරාන ණය මුදල් මීට ඇතුළත්ය.

## විනිමය පාලනය

**1. විනිමය පාලන ආකෘති පත්‍ර සංශෝධනය කිරීම**

ගෙවුම් ශේෂ සංඛ්‍යා තොරතුරුවලට අදාළ දත්තයන් එක් රැස් කිරීම පරිගණක යන්ත්‍රානු-සාරයෙන් සිදු කිරීමට හැකි වනු වස් සමාලෝචනයට අදාළ කාලච්ඡේදය තුළදී සංශෝධිත විනිමය පාලන ආකෘති පත්‍ර සමූහයක් නිකුත් කරන ලදී.

**2. අනේවාසික ආවෘත ගිණුම්**

අනේවාසික ආවෘත ගිණුම් අර්ථලාභීන් වෙත ආවෘත ගිණුම්ගත අරමුදල් වලින් රු. 100,000 ක උපරිමයක් දක්වා තවදුරටත් මුද හරින ලදී. ආවෘත අරමුදල් අනුමත ආයෝජනයන්හි අයෝජනය කර ඇති අවස්ථාවන්හිදී එබඳු ආයෝජන මත උප ලබ්ධ වීමෙන් ලැබෙන ඵල අදාළ ආවෘත ගිණුම්වලට නැවත බැර කිරීමට හැකි වනු ඇති අතර, ඉන් අනතුරුව විදේශවලට ප්‍රේෂණය කිරීමට හැකි වනු ඇත. මේ අනුව අනේවාසික ආවෘත ගිණුම් වලින් ප්‍රේෂණය කළහැකි උපරිමය රු. 200,000 දක්වා වැඩි කරන ලදී.

**3. නේවාසික විජාතිකයින්ගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ක්‍රමය ආරම්භ කිරීම**

තාවකාලික වශයෙන් හෝ 'නේවාසික වීසා බලපත්' මත ස්ථිර වශයෙන් හෝ ශ්‍රී ලංකාවෙ පදිංචි වී සිටින විජාතිකයින් සඳහා ශ්‍රී ලංකාවේ වෙළඳ බැංකුවල නියම කරනු ලබන විදේශ ව්‍යවහාර මුදල් වලින් ගිණුම් පවත්වාගෙන යාමේ පහසුකම් සැපයීම සඳහා වැඩ පිළිවෙලක් 1980.05.14 වැනි දින ආරම්භ කරන ලදී.

**4. ආනයන**

(i) වාහනය ප්‍රථමයෙන් ලියාපදිංචි කරන ලද දින සිට ආනයනය කරනු ලබන දින වනවිට වසර පහකට අඩුවෙන් කල්ගතවී ඇත්නම් හැර බ්‍රසල්ස් තීරු ගාස්තු නාමාවලියේ ශීර්ෂ යටතේ නිශ්චිත කිසිම මෝටර් රථයක් 1977 අංක 1 දරන විශේෂ ආනයන බලපත්‍රය යටතේ රට තුළට ආනයනය නොකළයුතු බවට අංක ඊසී/29/80 (බී) දරන මෙහෙයවුම් උපදෙස් මගින් බලය ලත් වෙළඳුන් වෙත දැනුම් දෙන ලදී.

(ii) ශ්‍රී ලංකා අපනයන බහාලන බඳුන් (තේ පෙට්ටි පනේල) නිෂ්පාදනය පිණිස ගනු ලබන තුනී ලෑලි ආනයනය කිරීම සඳහා ණයවර ලිපි ස්ථාපනය කිරීම පිණිස ආනයන සහ අපනයන පාලක විසින් නිකුත් කරනු ලබන ආනයන බලපත්‍රයක් ලබා ගැනීමේ නියමය 1980 නොවැම්බර් මස 7 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරන ලදී.

**5. අපනයන**

(i) කොළඹ වරාය තුළ අන්තරාල වෙළඳාම දිරි ගැන්වීමේ අරමුණින් 1977 අංක 1 දරන විශේෂ ආනයන බලපත්‍රයෙහි III වැනි උප ලේඛණය ප්‍රකාර භාණ්ඩ ආනයනය කිරීමට සුදුසුකම් ලැබ ඇති, එමෙන්ම එසේ ආනයනය කරනු ලබන භාණ්ඩ ලාභයක් මත පසුපස ණයවර ලිපි පදනමක් මත අපනයනය කිරීමට බලාපොරොත්තු වන්නාවූ තැනැත්තන්ගෙන් අපනයන සඳහා අයදුම්පත් සළකා බැලීමට තීරණය කරන ලදී. අන්තරාල වෙළඳාම යටතේ නැවත අපනයනය කිරීම සඳහා රෙදිපිළි, මැසූ ඇඳුම්, කරාබුනැටි, නිද්‍රාජනක ද්‍රව්‍ය, යුද්ධායුධ සහ වෙඩි ද්‍රව්‍ය. ආනයනය කිරීම සම්පූර්ණයෙන් තහනම් වේ.

(ii) මැණික් හා රන් ආභරණ වාණිජමය පදනමක් මත අපනයනය කරන්නන් වෙත හා විදේශ සංචාරකයින් හා විදේශ අමුත්තන් වෙත විදේශ විනිමය මත මැණික් හා රන් ආභරණ දේශීය වශයෙන් වෙළඳාම් කරන්නන් වෙත මැණික් හා රන් ආභරණ ව්‍යාපාරයට අවශ්‍ය යෙදවුම් සැපයීමේ අරමුණින් විදේශ විනිමය රැඳවීමේ ක්‍රමයක් ආරම්භ කරන ලදී.

UNIVERSITY OF ... LIBRARY



(iii) තිරිඟු පිටි කම්හල පාලනය කරනු ලබන සීමාසහිත ප්‍රීමා සිලෝන් සමාගම මගින් අතුරු නිෂ්පාදන හා ඉවත දැමූ ද්‍රව්‍ය අපනයනය කිරීමෙන් ලබා ගන්නා විකුණුම් මුදල් සම්බන්ධයෙන් විනිමය පාලන නියමයන් නොසළකා හරින ලෙස 1980.11.11 වැනි දින හා අංක ඊසී/47/80(එච්) දරන මෙහෙයවුම් උපදෙස් මගින් බලය ලත් වෙළඳුන් වෙත දැනුම් දෙන ලදී.

## සේවක අර්ථසාධක අරමුදල

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව මාර්ගයෙන් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ, දායක දීමනා හා අධිභාර මුදල් ද, අරමුදලේ මුදල් ආයෝජනයෙන් උපචිත වෙනත් ආදායම් ලැබීම් ද, පනතේ 5 වැනි වගන්තියේ නියමයන්ට අනුව මෙහි මුදල් පිළිබඳව අනෙකුත් කාර්‍යයන් ඉටු කිරීම ද නොකඩවා කරගෙන ගියේ ය. 1980 වර්ෂය තුල එහි මෙහෙයවුම් පිළිබඳව සංක්ෂිප්ත සටහනක් මෙහි පහත දක්වා ඇත.

### දායක මුදල්

1980 වර්ෂය තුළ දී අරමුදලට ලැබුණු දායක දීමනා ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 741·03ක් වූ අතර 1979 වර්ෂයේ එය රුපියල් දශ ලක්ෂ 597.54 ක් විය. මෙය කලින් වර්ෂයේ ලැබුණු දායක දීමනා මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 143.49 ක නැතහොත් සියයට 24 . 01ක වැඩිවීමකි.

පණතේ විධාන ක්‍රියාත්මක කිරීම සඳහා කම්කරු අමාත්‍යාංශයට සහායවීමේ අදහසින්, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ දී සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු එම අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය කරන ලදී. මෙම වැඩ පිළිවෙළින් මූලිකව අදහස් කරන ලද්දේ සේ.අ.අ. දායක දීමනා ගෙවීම පැහැර හරිනු ලැබූ සේව්‍යයන් වෙන් කැර ගැනීම සහ සියළුම දායක දීමනා පිළිබඳ වර්ග කරනු ලැබූ මාසික ප්‍රකාශයක් කම්කරු කොමසාරිස් වෙත සැපයීමත් ය.

1981 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි සේ.අ.අ. ට කරනු ලබන දායක දීමනා අනුපාතය, සේවකයා විසින් සියයට 6 — සියයට 8 දක්වා ද සේව්‍යයා විසින් සියයට9 සියයට12 දක්වා ද වැඩි කිරීමට 1980 නොවැම්බර් මාසයේ දී රජය විසින් තීරණය කරන ලදී.

### සාමාජිකයින්ගේ ශේෂ

1980 අවසානයේ දී. 1980 වර්ෂය සඳහා පොළී වෙන් කිරීමට පෙර සාමාජිකයන්ගේ ශේෂයන් රුපියල් දශලක්ෂ 4,620.34ක්ව පැවැති අතර, මෙය 1979 මට්ටමට වඩා රුපියල් දශලක්ෂ 851.06ක නැතහොත් සියයට 22.58ක වැඩිවීමකි. 1979 වර්ෂයේ ශේෂය රුපියල් දශලක්ෂ 3,768.28 ක්ව පැවතිණි.

### ආයෝජන

මෙම අරමුදල විසින්, සමාලෝචිත වර්ෂය තුළ දී කලින් සුරැකුම්පත් වල කල්පිරුණු ප්‍රේෂණයන් වන රුපියල් දශලක්ෂ 137·21 ඇතුළුව රුපියල් දශලක්ෂ 1,022·50ක් රජයේ සුරැකුම් වල ආයෝජනය කරන ලද අතර, මෙය 1979 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 781·06ක් විය. එම නිසා, 1979 වර්ෂයේ මට්ටමට වඩා දළ වැඩිවීම රුපියල් දශලක්ෂ 104·23ක නැතහොත් සියයට 13·34කි. මුදල් මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවක් මගින්, අරමුදලේ ආයෝජනයන් විවිධාංගීකරණය කිරීමේ හැකියාව සම්බන්ධයෙන් කලින් කල පරීක්ෂා කර බලනු ලැබේ.

### ආයෝජනයන්ගෙන් ලැබෙන ආදායම

1980 වර්ෂයේ දී අරමුදලේ ආයෝජනයන්ගෙන් ලැබූ ආදායම රුපියල් දශලක්ෂ 351·61ක් වූ අතර 1979 දී එය රුපියල් දශලක්ෂ 268·83ක් විය. කලින් වර්ෂයේ වැඩිවීම වූ රුපියල් දශලක්ෂ 62·70 නැතහොත් සියයට 30·42 හා සසඳන කල මෙය රුපියල් දශලක්ෂ 82·78 ක

නැතහොත් සියයට 30·79ක වැඩිවීමක් වාර්තා කරයි මෙම වැඩිවීමට මූලික හේතුව වූයේ අරමුදල වෙත ලැබුණු අධික දායක දීමනා ප්‍රමාණය ආයෝජනය කිරීම හා සමාලෝචිත වර්ෂය තුළ ආයෝජන වලින් ඉපයූ ආදායම් ප්‍රති ආයෝජනය කිරීමත් ය.

**ප්‍රතිලාභ ගෙවීම**

1980 වර්ෂය තුළ දී සාමාජිකයනට, සේ.අ.අ. ප්‍රතිලාභ වශයෙන් ආපසු ගෙවන ලද මුළු මුදල රුපියල් දශලක්ෂ 205·36ක් වූ අතර, 1979 දී එය රුපියල් දශලක්ෂ 140·51 ක් විය. 1979 වර්ෂය හා සසඳන කල මෙය රුපියල් දශලක්ෂ 64·85ක නැතහොත් සියයට 46·15 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. 1980 දී ආපසු ගෙවන ලද ප්‍රතිලාභ සංඛ්‍යාව 50,968ක් වූ අතර, 1979 වර්ෂයේ දී එය 43,066ක් විය.

ඉන්දියානු සම්භවය ඇති පෙරළා සියරට යන්නන්ට සේ.අ.අ. ප්‍රතිලාභ ආපසු ගෙවීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව විසින් 1976 දී නව ක්‍රියා පිළිවෙතක් හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රමය යටතේ තැපැල් පැවරුම් මගින් ඉන්දියාවට අරමුදල් යැවීම සඳහා පමණක් මුදල් කරගත හැකි චෙක්පතකින් පෙරළා සියරට යන්නන්ගේ සේ.අ.අ. ප්‍රතිලාභ ගෙවනු ලැබේ. මෙම ක්‍රමය අනුව පෙරළා සියරට යන්නන් හට ඔවුන් ගේ සේ.අ.අ. ප්‍රතිලාභ හැකි කෙටිම කාලසීමාවක් තුළදී ගෙවන බව සහතික කෙරේ.

**සාමාජිකයන්ගේ ශේෂ සඳහා පොළිය**

සේවක අර්ථසාධක අරමුදල, සෑම වර්ෂයකම අවසානයේ ඇති සාමාජිකයින්ගේ ශේෂ සඳහා අරමුදලේ මුදල් ආයෝජනයෙන් ලැබෙන ආදායමෙන් පොළී ගෙවිය යුතු වේ. 1980 අවසානයේ සාමාජිකයන්ගේ ශේෂ සඳහා ගෙවිය යුතු පොළී අනුපාතය සියයට 8 සිට සියයට 8·5 දක්වා වැඩි කෙරිණ.

වර්ෂය අවසානයේ සාමාජිකයින් ගේ බැරට පවතින ශේෂ සඳහා පොළිය ගෙවන අතර, ඉන් අනතුරුව එම මුළු මුදල වෙනුවෙන් පොළිය එක් රැස්වන බැවින්, පොළිය වැල් පොළියක ස්වරූපය ගනී. මේ හැර එම ශේෂයට අදාල (වර්තන වර්ෂයේ දායක දීමනා නියෝජනය වන) කිසියම් කොටසක්, සාමාජිකයා ගේ බැරට අරමුදල වෙත ලැබුණ දිනය සැලකිල්ලට නොගෙන වර්ෂය අවසානයේ සාමාජිකයා ගේ බැරට ඇති ශේෂ වෙනුවෙන් මුළු වර්ෂය සඳහාම පොළිය ගෙවනු ලැබේ. උදාහරණයක් වශයෙන් ජනවාරි මාසයේ ලැබුණු දායක දීමනා වලට ගෙවනු ලබන පරිද්දෙන් ම එම වර්ෂයේ දෙසැම්බර් මාසයේදී ලැබෙන දායක මුදල් වෙනුවෙන්ද, සම්පූර්ණ වර්ෂය සඳහාම පොළිය ගෙවනු ලැබේ. එබැවින් ක්‍රියාත්මක වන පොළී අනුපාතය සියයට 8·5 ට වඩා තරමක් වැඩි ය.

**දෙපාර්තමේන්තුවේ පරිපාලනය**

(අ) සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ පරිශ්‍රමය මූලික වැදගත් කමක් ඇති අරමුණු තුනක් ඉටුකර ගැනීම සඳහා යොමු විය. පළමුව 1979 වර්ෂය සඳහා වන වාර්ෂික ප්‍රකාශන 1981 ජනවාරි අවසන් වන විට (යටත් පිරිසෙයින්) පිළියෙල කිරීම. මෙය 1980 ප්‍රකාශන සැකසීම 1981 මාර්තු මාසයේ දී ඇරඹීමට හැකියාවක් වනු ඇත.

(ආ) දිනපතා සේවායයන්ගෙන් ලැබෙන 'සී' වාර්තාවල නම් සහ සාමාජික අංක පිරික්සීම සහ 'සී' වාර්තා සැකසීම සම්බන්ධිත වැඩ කටයුතු ප්‍රමාදයකින් තොරව ඉටුකිරීම සඳහා දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී වී ඇත.

(ඇ) සේ.අ.අ. ක්‍රියා පිළිවෙත සමාලෝචනය කොට පෘථුල ප්‍රතිශෝධිත සේ. අ. අ. ක්‍රියා පිළිවෙතක් සැලසුම් කිරීම සඳහා දෙපාර්තමේන්තුව, 1980 අප්‍රේල් මාසයේ දී ක්‍රියා පිළිවෙත් නිරීක්ෂණ කමිටුවක් පිහිටුවිය.

(ඈ) ප්‍රථම පියවරක් ලෙස, නම් සහ සාමාජික අංක සහිත පූර්ව මුද්‍රිත 'සී' වාර්තා නිකුත් කිරීමට කමිටුව තීරණය කළාය.

දැනට ඇති දත්තයන් මත, අරමුදලේ මෙහෙයවූම් පිළිබඳ සම්පිණ්ඩාත්මකව 2·12 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**2 · 12 සංඛ්‍යා සටහන**

**සේවක අර්ථසාධක අරමුදල 1979–1980**

| ශීර්ෂය | 1979 | 1980 |
|---|---|---|
| 1· මුළු සේවායතන සංඛ්‍යාව .. | 54,823 | ලැ. නො. |
| 2· ලැබුණු දායක මුදල් (රු.) .. | 597,542,565 (අ) | 741,032,542 (ආ) |
| 3· ආයෝජන (රු.) .. | 781,057,583 | 1022,500,194 (ඇ) |
| 4· ආයෝජන වලින් ලැබූ ආදායම (රු.) .. | 268,830,708 | 351,608,138 |
| 5· ප්‍රතිලාභ ගෙවීම් (රු.) .. | 140,514,129 | 205,355,353 |
| 6· ප්‍රතිලාභ සංඛ්‍යාව (රු ) .. | 43,066 | 50,968 |
| 7· පොළී අනුපාතය (%) .. | 8·0 | 8·5 |
| 8· සාමාජිකයන්ගේ ශේෂයන් මත පොළිය (රු.) | 301,542,604 | 392,728,736 |

(අ) අවිනිශ්චිත ගිණුම් වලට බැර කළ දායක මුදල් හැර.

(ආ) අංක. 1 ගිණුමට දායක මුදල් මාරු කිරීමේ අදහසින්, අවිනිශ්චිත ගිණුමට බැර කළ දායක මුදලද ඇතුළුව.

(ඇ) රජයේ සුරැකුම්වල ප්‍රති–ආයෝජිත කල්පිරි ප්‍රේෂණ ඵලයයන් ඇතුළුව.

**සංඛ්‍යාන**

දත්ත එක්රැස් කිරීම, විශ්ලේෂණය හා ඒවා ප්‍රකාශයට පත්කිරීම පිළිබඳ සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ වැඩකටයුතු 1980 දීද සිදුකැරිණි. පාරිභෝගික මුදල් සමීක්ෂණය පිළිබඳ පරිගණක දත්ත සැකැසුම නිමකළ නොහැකි වූයෙන්, මෙම වාර්තාව 1980 දී නිකුත් කළ නොහැකි වූ නමුත්, ප්‍රධාන දත්ත අඩංගු ප්‍රාරම්භක වාර්තාවක් 1981 මුල් භාගයේදී නිකුත් කරනු ලැබේ. දිපව්‍යාප්ත දත්ත එක්රැස් කිරීමේ සැලැස්ම 1980 වසරේදි ක්‍රියාත්මක කරන ලද අතර, මිළ හා වැටුප් සංඛ්‍යාලේඛන නමින් නව ප්‍රකාශනයක් පළකැරිණි. තවද මෙම දෙපාර්තමේන්තුව එහි සුපුරුදු ප්‍රකාශණයන්ද නිකුත් කළේය.

දත්ත එක්රැස් කිරීම, විශ්ලේෂණය හා ප්‍රකාශයට පත්කිරීම සම්බන්ධ කටයුතු සමහරෙක ප්‍රගතිය පහත දක්වේ.

**පාරිභෝගික මුදල් හා සමාජයීය ආර්ථික සමීක්ෂණය 1978/1979.**

සමීක්ෂණයේ වට සතරේම දත්ත, සංස්කරණය කරන ලදුව චුම්බක පටවලට නගන ලදී. සංඛ්‍යාන සටහන් අඛණ්ඩව සැකසිණි. පරිගණක දත්ත සැකසුම නිම කර ගත නොහැකි වූ බැවින්, අපේක්ෂිත දිනය-1980 ඔක්තෝබර් මාසයට කලින් වාර්තාව ප්‍රකාශයට පත් කිරීම අපහසු විය. ආදායම හා රැකියා නියුතුව පිළිබඳ ප්‍රධාන සොයාගැනීම් ඇතුළත් ප්‍රාරම්භක වාර්තාවක් 1981 මුල් භාගයේදී නිකුත් කරන අතර, අවසන් වාර්තාව 1981 අග භාගයේදී නිකුත් කරනු ලැබේ.

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ ලෝක බැංකු ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමයේ ආරම්භක සටහන් සමීක්ෂණය**

මෙම සමීක්ෂණයේ දත්තයන් 1978/79 පාරිභෝගික මුදල් හා සමාජයීය ආර්ථික සමීක්ෂණය හා ඒකාබද්ධ කරන ලදුව 1978/79 පාරිභෝගික මුදල් සමීක්ෂණයට සමගාමී ලෙස සකසන ලද නමුත් නිම නොකැරිණි.

**දිපව්‍යාප්ත දත්ත එක්රැස් කිරීමේ සැලැස්ම**

1979 වර්ෂයේ ආරම්භ කරන ලද දීපව්‍යාප්ත දත්ත එක්රැස් කිරීමේ සැලැසුම 1980 වර්ෂයේදීද ක්‍රියාත්මක කැරිණි. මෙම වැඩ සටහන මගින් පාරිභෝගික අයිතමයන් 220 ක පමණ සිල්ලර මිළ, ප්‍රධාන පෙළේ කෘෂිකාර්මික නිෂ්පාදනයන්ගේ නිෂ්පාදන

මිළ, වී ගොවිතැන, කුඩා තේ, රබර් හා පොල්වතු හා ඉදිකිරීම් කර්මාන්තයේ වැටුප් අනුපාත හා වී ගොවිතැන, තේ, රබර් හා පොල් වගාවල යෙදවුම්හි සිල්ලර මිළ පිළිබඳව දත්ත එක්රැස් කරනු ලැබේ. පාරිභෝගික භාණ්ඩ, කෘෂිකාර්මික යෙදවුම් හා ශ්‍රමය සපයා ගැනීමට ඇති හැකියාව පිළිබඳව ද තොරතුරු එක්රැස් කරනු ලැබේ. මෙම දත්ත, රටේ තෝරාගත් නාගරික මධ්‍යස්ථාන 100 න් නිත්‍ය පදනමක් මත එක්රැස් කරනු ලැබේ. එක්රැස් කර ගත් මෙම දත්ත "මිළ හා වැටුප් සංඛ්‍යාලේඛන, සිල්ලර නිෂ්පාදන හා යෙදවුම්වල මිළ හා වැටුප් පිළිබඳ මෑත ප්‍රවණතා" නමැති ප්‍රකාශනයෙහි පළවිය.

### පාරිභෝජන රටා හා වියදම් පිළිබඳ සමීක්ෂණය

1979 හා 1980 වර්ෂවල පෙබරවාරි, මාර්තු සහ අප්‍රේල් මාසයන්හි ග්‍රාමීය කලාපයේ පරිභෝජන රටා හා වියදම පිළිබඳ සමීක්‍ෂණයක් දීපව්‍යාප්ත පදනමක් මත පවත්වන ලද අතර, ඒ පිළිබඳ වාර්තාවක් සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

### සැළසුම් කරන ලද ආයෝජන පිළිබඳ සමීක්ෂණය

පෞද්ගලික අංශයේ සැළසුම් කරන ලද ආයෝජන පිළිබඳ සමීක්‍ෂණයක් 1980 ජූලි මාසයේ සිට තැපැල් විමසුමක් මගින් පවත්වන ලදී. නියැදියේ ප්‍රතිචාර අනුපාතය සියයට 45 පමණ වූ අතර, එක්රැස් කොට ගත් තොරතුරුවල පදනම මත පෞද්ගලික අංශයේ ආයතන විසින් සැළසුම් කර ඇති ආයෝජන පිළිබඳ තාවකාලික ඇස්තමේන්තු පිළියෙල කරන ලදී.

### ආනයන ලිහිල් කිරීමේ වැඩසටහන පිළිබඳ සමීක්ෂණය

ආනයන හා අපනයන වෙනුවෙන් විවෘත කරන ලද ණයවර ලිපි, ණයවර ලිපි සංශෝධනය හා ණයවර ලිපිවලට ප්‍රතිපක්‍ෂව කරන ලද බිල්පත් පිළිබඳව මාසික දත්ත එක්රැස් කිරීම මගින්, ආනයන ලිහිල් කිරීමේ වැඩසටහන සමීක්‍ෂණය කිරීමේ සැළැස්ම දෙපාර්තමේන්තු විසින් නොකඩවා කරගෙන ආයේය. පරිභෝජන, අන්තර් හා ආයෝජන භාණ්ඩ යනුවෙන් තවදුරටත් වර්ගීකරණය කොට, 1978 වාර්ෂික වාර්තාවේ (98 පිටුව) දැක්වෙන ප්‍රකාර මෙම දත්ත වක්‍රගත කරන ලදී. නිත්‍ය පදනමක් මත මෙම දත්ත සමහර අදළ අමාත්‍යාංශවලට සපයන ලදී.

### ලෝක බැංකු පර්යේෂණ ව්‍යාපෘතිය – බහු වාර්ෂිකයන් – තේ හා රබර් සැපැයුම සඳහා ආර්ථික මෙට්‍රිකායන ආදර්ශ තැනීම

වතු 50 ක නියැදියකින් රබර් වගාවේ ඓතිහාසික දත්ත එක්රැස් කරගන්නා ලදී. දත්ත එක්රැස් කිරීම ජනවසම හා ශ්‍රී.ලං.රා.වැ.සං. ප්‍රධාන කාර්යාල මගින් අදල වතු අධිකාරීන්ට පවරා දෙන ලදී. මෙම දෙපාර්තමේන්තුවේදී මෙම දත්තයන් සංස්කරණය කරන ලදුව ලෝක බැංකුව වෙත යවනු පිණිස පරිගණක පට ගත කරනු ලැබේ.

### පෞද්ගලික ආයෝජන සමීක්ෂණය

මෙම සමීක්‍ෂණයේ දත්ත සකස් කෙරෙමින් පැවති නමුත් 1978/79 පාරිභෝගික මුදල් හා සමාජයීය ආර්ථික සමීක්‍ෂණය පිළිබඳ දත්ත සැකසීම සඳහා ප්‍රමුඛත්වය දියයුතු වූයෙන් එය ඇණහිටුවීමට සිදුවිය.

### ග්‍රාමීය ණයගැතිභාවය හා 1975/76 කෘෂිකාර්මික ණය ආපසුගෙවීම පිළිබඳ සමීක්ෂණය

මෙම සමීක්‍ෂණය පිළිබඳ කෙටුම්පත් වාර්තාව නිමවන ලදී.

1980 වසර තුළ සංඛ්‍යාලේඛන ප්‍රකාශන සතරක් පළකරන ලදී.

(1) සමාජයීය ආර්ථික පත්‍රිකාව— 1980.

(2) ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජයීය සංඛ්‍යාලේඛන.

වෙළුම 2 අංක 1 හා 2.

(3) මිළ හා වැටුප් සංඛ්‍යාලේඛන.

වෙළුම 1 අංක 2.

## ආයතන කටයුතු

කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, උසස් කිරීම, කාර්ය අගැයීම පිළිබඳ සියළු කටයුතු, විනයානුකූල කටයුතු හා කාර්ය මණ්ඩලයට අදළ කටයුතුවල තවදුරටත් ආයතන දෙපාර්තමේන්තුව නිරත වූයේය.

### සේවයට බඳවා ගැනීම

1979 ඔක්තෝබර් මාසයේ සිට මාණ්ඩලික පංතියේ හා කාර්මික ශ්‍රේණියේ නොවන අනෙකුත් සියළුම සේවා ගණයන් සඳහා බඳවා ගැනීම් සිදු කරන ලද්දේ රැකියා බැංකුවෙන් එවන ලද අපේක්ෂකයන් අතුරෙනි.

### පෞද්ගලික විස්තර ලේඛනය

දනට තිබෙන මිනිස් බලය හා අනාගත මිනිස් බල අවශ්‍යතා පිළිබඳ සංඛ්‍යා ලේඛනවය හා අනෙකුත් දත්ත අධ්‍යයනය කිරීම හා පිළියෙල කිරීම පහසු කරවනු වස් බැංකුවේ සිටින සියළුම මාණ්ඩලික නිලධාරීන්ට අදල පෞද්ගලික දත්ත පිළිබඳ සම්පූර්ණ විස්තර ලේඛන පිළියෙල කිරීමට පියවර ගෙන ඇත. බැංකුවේ සියළුම සේවකයන් ආවරණය කැරෙනසේ මෙම ව්‍යායාමය ව්‍යාප්ත කිරීමට අදහස් කෙරේ.

### ප්‍රතිසංවිධානය

(අ) මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල මාතර හා අනුරාධපුර නගරවල පිහිටුවීමට පියවර ගනිමින් පවතී.

(ආ) පහත සඳහන් කාර්යයන් හා රාජකාරි ඉටු කිරීම සඳහා මහ බැංකුවෙහි අභිනවයෙන් ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවක් පිහිටුවා ඇත.

i. කාර්යක්ෂම හා යාවත්කාලීන පුස්ථකාල සේවා පවත්වාගෙන යෑම ක්‍රියාත්මක කිරීම.

ii. විවිධ ප්‍රකාශන, සඟරා හා පුවත්පත් වලින් අදළ තොරතුරු උපුටා ගෙන ඒවා බැංකු නිලධාරීන් හා උනන්දුවක් දක්වන වෙනත් පුද්ගලයින් අතර සංසරණය කිරීම.

iii. බැංකු ප්‍රකාශන විකිණීම හා බෙදා හැරීම.

iv. ප්‍රචාරක කටයුතු, පුවත්පත්, හා මහජනතාව වෙත ප්‍රවෘත්ති සැපයීම.

v. කලින් කලට මහ බැංකුව විසින් සංවිධානය කෙරෙන සම්මේලන, සම්මන්ත්‍රණ හා වැඩ මුළු ආදිය සඳහා විධිවිධාන සම්පාදනය කිරීම.

vi. මේ දක්වා ලේකම් දෙපාර්තමේන්තුවේ සංධාන අංශය විසින් ඉටු කෙරුණු කටයුතුවල නියැලීම.

vii. කලින් කලට පැවරීමට ඉඩ ඇති වෙනත් ඕනෑම කාර්යයන්හි නියැලීම.

## පුහුණු කිරීම්

පුහුණු කිරීමේ අංශය විසින් බැංකු කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමට අදාල කටයුතු තවදුරටත් කරගෙන යනු ලැබීය. බැංකු කාර්ය මණ්ඩලය සඳහා පිළියෙල කෙරෙන පශ්චාත් උපාධි පුහුණු කිරීමේ හා කෙටිකාලීන පුහුණු කිරීමේ පාඨමාලාවලට අතිරේකව දේශීය බැංකු නිලධාරීන් සඳහා මෙම අංශය විසින් පහත සඳහන් අභ්‍යාස වැඩසටහන් සංවිධානය කරන ලදී.

1980 වර්ෂය තුල පවත්වන ලද අභ්‍යාස වැඩසටහන්:

1. නිව්යෝර්කයේ අර්වින් ට්‍රස්ට් බැංකුව විසින් මැයි 5 වැනි දින පවත්වන ලද 1980 ''ආනයන-අපනයන/බැංකුකරුවන්ගේ ප්‍රතිග්‍රහණ මූල්‍යකරණය'' පිළිබඳ සම්මන්ත්‍රණය.

2. ඉන්දියාවේ රිසව් බැංකුවේ කෘෂිකාර්මික බැංකු කටයුතු විදුහල විසින් වෙළෙඳ බැංකුවල හා මහ බැංකුවේ නිලධාරීන් සඳහා, කොළඹ 7, විජේරාම මාවතේ, කෘෂිකාර්මික පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙහිදී පවත්වන ලද ''සුළු ගොවි ණය කළමනාකාරිත්වය'' පිළිබඳ අභ්‍යාස වැඩසටහන.

## කාර්ය මණ්ඩල පුවත්

1980 වර්ෂය තුළදී අධිපති, ආචාර්ය ඩබ්ලිව්. රාසපුත්‍රම් පහත සඳහන් සමුළු, රැස්වීම් හා සම්මන්ත්‍රණ වලට සහභාගි විය.

(අ) සිංගප්පූරුවෙහි පැවැත්වුණු අග්නිදිග ආසියාතු මහ බැංකු (සියැසන්) අධිපතිවරුන්ගේ දහසය වැනි වාර්ෂික රැස්වීම (ජනවාරි 16-19);

(ආ) බුරුමයේ රංගුන් නුවර පැවැත්වුණු ආසියාතු නිෂ්කාශන සංගමයේ (ආ.නි.ස.) අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අටවැනි වාර්ෂික රැස්වීම (පෙබරවාරි 4-5);

(ඇ) ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවේ, හැම්බර්ග්හි පවත්වන ලද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ.අ.) අතුරු කමිටු, ජා.මූ.අ./ලෝක බැංකුවේ සංවර්ධන කමිටු හා 'රටවල් 24 කණ්ඩායම්' රැස්වීම, බ්‍රසල්ස් හා ලන්ඩන්හි පැවති නිළ සාකච්ඡා (අප්‍රියෙල් 19-මැයි 2);

(ඈ) ලන්ඩන්, බර්මිංහැම්, මියුනික්, හැම්බර්ග්හි මහ කොළඹ ආර්ථික කොමිසම විසින් මෙහෙයවන ලද ආයෝජන දිරිගැන්වීමේ සම්මන්ත්‍රණ (ජුනි 21-ජුලි 12);

(ඉ) නිව්යෝක්හිදී මහ කොළඹ ආර්ථික කොමිසම විසින් මෙහෙයවන ලද ආයෝජන දිරිගැන්වීමේ සම්මන්ත්‍රණය හා වොෂිංටනයේදී පවත්වන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ලෝක බැංකුවේ රැස්වීම (සැප්තැම්බර් 11-ඔක්තෝබර් 3);

(ඊ) ඉන්දුනීසියාවේ, ජකර්තාවෙහි පැවැත්වුණු මහ බැංකු අධිපතිවරුන්ගේ 13 වන සියැන්සා සමුළුව (නොවැම්බර් 20-21)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය ඩබ්ලිව්. එම්. තිලකරත්න මුදල් මණ්ඩලයේ නිළ සාමාජිකයා වශයෙන් තව දුරටත් කටයුතු කළේය.

භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් සී. පී. චන්මුගම් මහතා, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය තිලකරත්න දිවයිනෙන් බැහැරව සිටි කාල සීමාවලදී මුදල් මණ්ඩලයේ නිළ සාමාජිකයා වශයෙන් කටයුතු කළේය.

නියෝජ්‍ය අධිපති, ආචාර්ය ගාමණී කොරයා, ජිනීවාහි වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේ (අන්ක්ටෑඩ්) මහ ලේකම් වශයෙන් කටයුතු කිරීම පිණිස 1980.11.03 දිනතෙක් මුද හරිනු ලැබ සිටි අතර 1980.11.04 දින සිට මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ලැබීය.

නියෝජ්‍ය අධිපති, ඊ. එරමුදුගොල්ල මහතා, 1980 මාර්තු 31 වැනි දින දක්වා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වෛකල්පික විධායක අධ්‍යක්ෂ වශයෙන් සේවයෙහි නිරතව සිට 1980 ජූලි 16 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ලැබීය.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ආචාර්ය එච්. එන්. එස්. කරුණාතිලක, අධිපති දිවයිනෙන් බැහැරව ගොස් සිටි කාලසීමාවන් තුළදී, මුදල් නීති පනතේ 24 වැනි වගන්තිය යටතේ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කළේය.

අධිපතිගේ සහකාර ඩී. එල්. කන්නන්ගර මහතා, 1980 ජූලි 1 වැනි දින සිට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වෛකල්පික විධායක අධ්‍යක්ෂ ලෙස රාජකාරි භාර ගත්තේය.

උපදේශක ටී. ජී. පුංචි අප්පුහාමි මහතා, 1980 මාර්තු 21 වැනි දින සිට අධිපතිගේ සහකාර වශයෙන්ද, 1980 ජූලි 1 වැනි දින සිට මුදල් මණ්ඩලයේ ලේකම් වශයෙන්ද පත් කරනු ලැබීය.

ආර්ථික පර්යේෂ අධ්‍යක්‍ෂණ ජේ. එස්. ජයවර්ධන මහතා, 1980 ජූලි 1 වැනි දින සිට අධිපතිගේ සහකාර වශයෙන් පත් කරනු ලැබීය.

ප්‍රධාන ගණකාධිකාරි, වී. එස්. සුබ්‍රමානියම් මහතා, 1980 පෙබරවාරි 11 වැනි දින සිට, සොලමන් දිවයින්වල මුදල් අධිකාරියේ උපදේශක වශයෙන් වැඩ භාරගනු පිණිස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට මුද හරිනු ලැබීය.

සේවක අර්ථ සාධක අරමුදලේ අධිකාරි එස්. ඩබ්ලිව්. පී. අමරසූරිය මහතා 1980 අප්‍රියෙල් 5 වැනි දින සිට නිවාඩු ගිය අතර, වී. එන්. ඩී. නානායක්කාර මහතා 1980 අප්‍රියෙල් 7 වැනි දින සිට අධිකාරි වශයෙන් වැඩ බැලීම පිණිස පත් කරනු ලැබීය.

ආචාර්ය එස්. ටී. ජී. ප්‍රනාන්දු, ග්‍රාමීය ණය හා සංවර්ධන මුදල් අධ්‍යක්‍ෂකගේ රාජකාරි වලට අමතරව 1980 අගෝස්තු 1 වැනි දින සිට ආර්ථික පර්යේෂණ අධ්‍යක්‍ෂ වශයෙන් පත් කරනු ලැබීය.

වැඩ බලන අතිරේක ප්‍රධාන ගණකාධිකාරි එච්. ප්‍රේමරත්න මහතා මූල්‍යායතන පිළිබඳ අධීක්ෂකයකු වශයෙන් ගැම්බියාවේ මහ බැංකුවට සේවය කරනු සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත මුද හරිනු ලැබීය.

බැංකු පරිපාලන අධ්‍යක්‍ෂ යූ. ඒ. ද සිල්වා මහතා 1980 පෙබරවාරි 18 වැනි දින සිට ප්‍රධාන ගණකාධිකාරි වශයෙන් පත් කරනු ලැබීය.

වැඩ බලන අතිරේක ප්‍රධාන ගණකාධිකාරි ඒ. ටී. ඩබ්ලිව්. ජෙහෝරත්නම් මහතා, 1980 පෙබරවාරි 1 වැනි දින සිට වැඩ බලන විනිමය පාලක වශයෙන් පත් කරනු ලැබීය.

ඒ. එම්. සී. සිල්වා මෙනෙවිය 1980 අගෝස්තු 1 වැනි දින සිට ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්‍ෂ වශයෙන් පත් කරනු ලැබුවාය.

සමාලෝචිත වසර තුළ, මහ බැංකුවේ පහත නම් සඳහන් නිලධාරීහු, අර්ධ කාලීන පදනම මත තව දුරටත් රජයට සහ/හෝ රජයේ ආයතනවල මුද හරිනු ලැබ සිටියහ.

අධිපතිගේ සහකාර ටී. ජී. පුංචිඅප්පුහාමි මහතා රාජ්‍ය මැණික් සංස්ථාවේ සභාපති වශයෙන්, රාජ්‍ය ණය අධිකාරි එස්. රාජලිංගම් මහතා මහා භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්‍ෂ වශයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත;

අතිරේක ආර්ථික පර්යේෂණ අධ්‍යක්‍ෂ, එස්. රීස්පරදයන් මහතා මහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රතිපත්ති අධ්‍යක්‍ෂ වශයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත;

නියෝජ්‍ය ආර්ථික පර්යේෂණ අධ්‍යක්‍ෂ ආචාර්ය එල්. ටී. එන්. ප්‍රනාන්දු භාණ්ඩාගාරයේ ආර්ථික කටයුතු පිළිබඳ අතිරේක අධ්‍යක්‍ෂ වශයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත;

නියෝජ්‍ය ආර්ථික පර්යේෂණ අධ්‍යක්‍ෂ ආචාර්ය පී. ඒ. එස්. දහනායක, 1980 අගෝස්තු 31 වැනි දින දක්වා ජාතික මිළ කොමිසමේ මහ ලේකම් වශයෙන් වෙළඳ හා නාවික කටයුතු අමාත්‍යාංශය වෙත;

සමාලෝචිත වසර තුළ මහ බැංකුවේ පහත නම් සඳහන් නිලධාරීහු, පූර්ණකාලීන පදනම මත තව දුරටත් රජයට සහ / හෝ රජයේ ආයතනවලට මුද හරිනු ලැබ සිටියහ.

වී. කේ. වික්‍රමසිංහ මහතා ජාතික සංවර්ධන බැංකුවේ සාමාන්‍යාධිකාරී වශයෙන්;

ආචාර්ය ජී. ඩබ්ලිව්. පී. වික්‍රමසිංහ ශ්‍රී ලංකා අපනයන ණය රක්‍ෂණ සංස්ථාවේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්‍ෂ වශයෙන්;

ඒ. ඒ. ඩී. ජස්ටින් මහතා ශ්‍රී ලංකා ටයර් සංස්ථාවේ සභාපති සහ කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්;

පී. එම්. හසන් මහතා ආහාර කොමසාරිස් වශයෙන්;

ජී. එම්. පී ඩී. ද සිල්වා, ඩී. ජේ. එම්. මීගොඩ සහ ඒ. ඒ. ආර්. දිසානායක මහත්වරුන් ජාතික සංවර්ධන බැංකුව වෙත;

කේ. ජී. ධර්මසේන සහ සී. ටී. ජයසූරිය මහත්වරුන් ශ්‍රී ලංකා අපනයන ණය රක්‍ෂණ සංස්ථාව වෙත;

එම්. බී. දිසානායක මහතා, ආචාර්ය ඒ. සී. රත්දෙනි සහ ජී. වී. ඒ. පොන්සේකා මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත;

ඩබ්ලිව්. එල්. ද සිල්වා මහතා '1980 ජූනි 21 දින දක්වා "මාක්ෆෙඩ්" සාමාන්‍යාධිකාරී වශයෙන් ආහාර හා සමුපකාර අමාත්‍යාංශය වෙත;

මීට අතිරේකව මහ බැංකු නිලධාරීන් කීප දෙනෙක්ම රාජ්‍ය සංස්ථා මණ්ඩල, නිළ කමිටු හා වෙනත් රාජ්‍යායතනවල සේවය කළහ.